..............................................................................................................

(ii) දවල් බතට කොළඹ යාමට සූදානම් වූ කුමාරගුප්ත නැවැත්විය හැකි වූයේ කෙසේ ද?

..............................................................................................................

(iii) කුමාරගුප්ත ඉඳුල් කඩින් පිස දමන ලද පිගානේ හැඩහුරුකම ඡේදයේ විස්තර කර ඇත්තේ කෙසේ ද?

..............................................................................................................

(iv) 'නොහැකි' යන අර්ථයට සමාන අදහසක් ගෙන දෙන වචනයක් ඡේදයේ සඳහන් වේ. එම වචනය කුමක් ද?

..............................................................................................................

(v) 'නැත' යන අර්ථය හැඟවෙන අතීත කාල ඒකවචන ක්‍රියා පදයක් ඡේදයෙන් තෝරා ලියන්න.

..............................................................................................................

(vi) ඡේදයෙහි සඳහන් උපමාව ලියන්න.

..............................................................................................................

**2.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) කිරි බණ්ඩා ................... (පලතුරු / පළතුරු) ගස්වල ගෙඩි කන වඳුරන් පළවා හරියි.

(ii) බෙහෙතක් සැකසීමට කොළ වර්ග කිහිපයක් සොයා ගැනීමේ අදහසින් හේරත්හාමි ................... (වනයට / වණයට) ගියේ ය.

**3.** පහත සඳහන් එක් එක් වාක්‍යයේ උක්ත/ආඛ්‍යාත සම්බන්ධය **නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද** ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

(i) ගොයම් කපා අවසන් කළ ගොවියෝ කමතේ ගස් සෙවණේ ඉඳ ගත්හ. (.........)

(ii) මද සුළඟට ගස් සෙලවෙති. (.........)

(iii) මී මැස්සෝ මලින් මලට ගොස් පැණි උරා බොති. (.........)

(iv) ඔල්වරසන් හඬ මැද ක්‍රීඩිකාවෝ තරගය නිම කළා ය. (.........)

විභාග අංකය ..............................

278399

- අංක **7** සහ **8** ප්‍රශ්න සඳහා △ = 2, ▲ = 3, □ = 5, ■ = 6, ✳ = 8 ලෙස යොදා ගෙන හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

**7.**

□ △
\+ ▲ ■
.................

(1) △ △  (2) ■ ■  (3) ✳ ✳

**8.**

✳ ■ □
− □ ▲ △
.................

(1) ▲ ▲ ▲  (2) ■ ■ ■  (3) △ △ △

**9.** පහත එක් එක් රූපයේ ඇතුළත් සෘජුකෝණ සංඛ්‍යාව වැඩිවන අනුපිළිවෙළට පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.




(1) A, B, C  (2) A, C, B  (3) B, C, A

**10.** පහත වගුවේ දැක්වෙන අයගෙන් වයසින් අඩු ම තැනැත්තිය හා වයසින් වැඩි ම තැනැත්තිය අනුපිළිවෙළින් තෝරන්න.

| නම | උපන් දිනය |
|---|---|
| මාධවී | 2006.06.13 |
| රේවතී | 2007.10.02 |
| පාතිමා | 2006.04.28 |
| සමාධී | 2007.05.20 |

(1) පාතිමා, රේවතී
(2) සමාධී, මාධවී
(3) රේවතී, පාතිමා

**11.** පහත සඳහන් රූපවල ඇති සංඛ්‍යා රටාව අනුව හිස්තැනට තිබිය යුතු සංඛ්‍යාව තෝරන්න.




(1) 3
(2) 4
(3) 5

**12.** පහත දී ඇති සංවාදය කියවන්න.

A - ඉස්කෝලේ යන්නේ කොහොම ද? තෙමෙන්නයි වෙන්නේ.
B - අදත් වහීවි ද? අහස නම් කළු කරලා.
C - අමතක නොකර කුඩය අරන් යන්න.
D - ඊයේ දවසම වැස්සා. අදත් වහින පාටයි.

මෙම සංවාදය වඩාත් සුදුසු අනුපිළිවෙළට පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.

(1) A, D, C, B  (2) B, D, A, C  (3) C, D, B, A

278365

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**5**

**EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2017**

**පාසල්වලට සිසුන් තෝරාගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2017 අගෝස්තු**

# II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

විභාග අංකය :....................................

## විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
* පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉරි මත** ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**
* පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පරිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

**1.** පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

මේසයට ටිකක් ඈතින් වූ වීදුරු ඉලත්තට්ටුවක මතුයෙහි, සිහසුන අරා හිඳගත් කුමාරයකු මෙන් පිළිවැස්සෙන් වැසී සිටි කිරිමුට්ටිය දෙස බලමින් කුමාරගුප්ත තමා ඉදිරියෙහි වූ සුදු බොකුටු පිඟාන ද හැන්ද ද ඉඳුල් කඩින් දෙතුන් වරක් පිස දැමුවේ ය. ඔහු හැන්ද පිස දැමූ ආකාරයෙන් ද, තල්ල මැරූ විධියෙන් ද, තොල කට ලෙව කෑ සැටියෙන් ද, කිරිමුට්ටිය සම්පූර්ණයෙන් ම වුවත් කා ඇඹීමට නුපුළුවන් එකෙකැයි කිසිවකුට කිව හැකි නොවී ය. කොළඹ දී දවල් බත කන්ට සිතා ගෙන ඇඳපැළඳ ගත් ඔහු නැවැත්විය හැකි වූයේ දීකිරි මතක් කළ බැවිනි.

ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරාගෙන, **තිත් ඉරි මත ලියන්න**.

(i) ඡේදයෙන් කියැවෙන ආකාරයට කිරිමුට්ටිය තබා තිබුණේ කුමක් මත ද?

..........................................................................................................

(ii) දවල් බතට කොළඹ යාමට සූදානම් වූ කුමාරගුප්ත නැවැත්විය හැකි වූයේ කෙසේ ද?

..........................................................................................................

(iii) කුමාරගුප්ත ඉඳුල් කඩින් පිස දමන ලද පිඟානේ හැඩහුරුකම ඡේදයේ විස්තර කර ඇත්තේ කෙසේ ද?

..........................................................................................................

(iv) 'නොහැකි' යන අර්ථයට සමාන අදහසක් ගෙන දෙන වචනයක් ඡේදයේ සඳහන් වේ. එම වචනය කුමක් ද?

..........................................................................................................

(v) 'නැත' යන අර්ථය හැඟවෙන අතීත කාල ඒකවචන ක්‍රියා පදයක් ඡේදයෙන් තෝරා ලියන්න.

..........................................................................................................

(vi) ඡේදයෙහි සඳහන් උපමාව ලියන්න.

..........................................................................................................

**2.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) කිරි බණ්ඩා .................. (පලතුරු / පළතුරු) ගස්වල ගෙඩි කන වඳුරන් පළවා හරියි.

(ii) බෙහෙතක් සැකසීමට කොළ වර්ග කිහිපයක් සොයා ගැනීමේ අදහසින් හේරත්හාමි .................. (වනයට / වණයට) ගියේ ය.

**3.** පහත සඳහන් එක් එක් වාක්‍යයේ උක්ත/ආඛ්‍යාත සම්බන්ධය **නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද** ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

(i) ගොයම් කපා අවසන් කළ ගොවියෝ කමතේ ගස් සෙවණේ ඉඳ ගත්හ. (.........)

(ii) මඳ සුළඟට ගස් සෙලවෙති. (.........)

(iii) මී මැස්සෝ මලින් මලට ගොස් පැණි උරා බොති. (.........)

(iv) ඔල්වරසන් හඬ මැද ක්‍රීඩිකාවෝ තරගය නිම කළා ය. (.........)

[තුන්වැනි පිටුව බලන්න.

විභාග අංකය.................................

278365

4. පහත සඳහන් එක් එක් වාක්‍යයේ තද කළු අකුරුවලින් ඇති යෙදුමට වඩාත් ගැළපෙන අදහස වරහන් තුළින් තෝරාගෙන **රට යටින් ඉරක් අඳින්න.**

(i) පාසල් ගොස් එන අතර මඟදී සුනිමල් **නා කපන වැස්සකට** හසු විය.
(ධාරානිපාත වර්ෂාවකට / අකල් වර්ෂාවකට)

(ii) පාසලේ අධ්‍යාපන චාරිකාව පිටත් වන දිනය උදාවන තුරු සිසුහු **ඇඟිලි ගණන් කරමින්** සිටියහ.
(නොඉවසිල්ලෙන් / බලාපොරොත්තුවෙන්)

5. පහත සඳහන් වගන්තිවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරාගෙන **රට යටින් ඉරක් අඳින්න.**

(i) 'සිනා උපදවන' යන අදහස ප්‍රකාශ කෙරෙන තනි වචනයකි, ........................ .
(ජුගුප්සාජනක / හාස්‍යජනක)

(ii) "ගිරෙන් ගිරට පැන ලැගුම් සොයා පුබුදිමින් අරුණ කළමා
ගොර දෙමින් නැවත වට පිටින් බලති නෙක උහුළු විහිළු පුදුමා"

මෙම කවි දෙපදයෙන් කියැවෙන්නේ .......................... (වඳුරකුගේ / අශ්වයකුගේ) ගමන් විලාසය පිළිබඳව ය.

6. පහත සඳහන් කවියේ ඇති **හිස්තැන සම්පූර්ණ කරන්න.**

සොම්නස හෝ සන්තාපය හමුවේ
සිහි වේ සිහි වේ අම්මා
.....................................................
නිම කළ පිළිරුව අම්මා

7. පහත සඳහන් ස්ත්‍රී ලිංග නාම පදයට ගැළපෙන පුරුෂ ලිංග නාම පදය **තිත් ඉර මත ලියන්න.**

යෙහෙළිය :.......................

8. පහත සඳහන් වාක්‍යයේ **සුදුසු තැන්වලට විරාම ලකුණු යොදන්න.**

අපොයි දෙවියනේ මේ අවනඩුව කාට කියන්නද

9. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නයට පිළිතුර **තිත් ඉර මත ලියන්න.**

කිසි විටක අලස ව නැතී
මුළු දවස නිති වෙහෙසෙතී
නරන් මෙන් ගැටුමක් නැතී
එකා මෙන් සැම වැජඹෙතී

නිතරම මහන්සි වී වැඩ කරන බව වඩාත් හොඳින් ප්‍රකාශ කෙරෙන පද පේළිය මෙම කවියෙන් උපුටාගෙන ලියන්න.

.....................................................

10. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළේ **ඉතිරි කොටස සම්පූර්ණ කරන්න.**

ලූලා නැති වළට .......................................

[හතරවැනි පිටුව බලන්න.

**11.** පහත දී ඇති එක් එක් සිංහල වචනය සඳහා යෙදෙන ඉංග්‍රීසි වචනය **ඉංග්‍රීසි අකුරුවලින්** ලියන්න.

(i) හෙට : ......................................

(ii) දේදුන්න : ......................................

**12.** පහත දී ඇති එක් එක් ඉංග්‍රීසි වාක්‍යයේ හිස්තැනට සුදුසු වචනය කොටුව තුළ දී ඇති වචනවලින් තෝරාගෙන **හිස්තැන් සම්පූර්ණ කරන්න.**

| | |
|---|---|
| bakery | hospital |
| market | post office |

(i) We buy stamps from the ...................................... .

(ii) We buy vegetables from the .............................. .

**13.** පහත සඳහන් වාක්‍යය ඉංග්‍රීසි භාෂාවෙන් කියන ආකාරය **ඉංග්‍රීසි අකුරුවලින්** ලියන්න.

මට බඩගිනියි. :.................................................................................................

**14.** පහත සඳහන් **දෙමළ වචනයේ අර්ථය සිංහලෙන්** ලියන්න.

සිට්රුණ්ඩිච්චාලෙ : .................................................................................................

**15.** පහත සඳහන් වාක්‍යය **දෙමළෙන් කියන ආකාරය සිංහලෙන්** ලියන්න.

මම පාඩම් කරනවා. : .................................................................................................

**16.** නැගෙනහිර අහසේ පායා එන හිරුගේ ළා රැස් දහරින් මුළු ලොවම නැහැවෙද්දී ලොවට තවත් අලුත් දවසක් උදාවෙයි. උදාවන එම සුන්දර උදෑසන අපගේ ගතත් සිතත් ප්‍රබෝධමත් කරයි. අවට පරිසරයේ නැවුම් සුන්දරත්වයක් මැවෙයි. "උදෑසනක සුන්දරත්වය" යන මාතෘකාව පිළිබඳ ව වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක ම, **වචන පහකට වඩා වැඩියෙන් තිබිය යුතුයි. උක්ත / ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.**)

✳ .................................................................................................

.................................................................................................

✳ .................................................................................................

.................................................................................................

✳ .................................................................................................

.................................................................................................

- **දී ඇති තිත් ඉරි මත පිළිතුරු ලියන්න.**

**17.** "තිස්දහස් අනූනමය" යන සංඛ්‍යාවට එකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව **ඉලක්කමෙන්** ලියන්න.

..................................

**18.** මෙම කොටුව තුළ ඇති සංඛ්‍යා අතුරෙන් 9න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාව කුමක් ද? : ..................................

| | |
|---|---|
| 399 | 578 |
| 451 | 675 |

**19.** ඉරටු කැබැලි 5ක් යොදාගෙන සුපුන්, රෝම සංඛ්‍යාංකවලින් 8 සංඛ්‍යාව නිරූපණය කරයි. ඒ අනුව, 20ට අඩු සංඛ්‍යාවක් රෝම සංඛ්‍යාංකවලින් නිරූපණය කිරීමට සුපුන්ට ඉරටු කැබැලි 7ක් අවශ්‍ය විය.

එම සංඛ්‍යාව රෝම සංඛ්‍යාංකවලින් ලියන්න. ..................................

**20.** මෙහි දැක්වෙන්නේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර 1 බැගින් වන සමචතුරස්‍ර 10කින් සමන්විත රූපයකි.



මෙම රූපයේ අඳුරු කර ඇති කොටසේ වර්ගඵලය, මුළු වර්ගඵලයෙන් කුමන භාගයක් ද? ..........................

**21.** පහත දැක්වෙන හැඩතල යොදාගෙන සෑදිය හැකි ඝනවස්තු **දෙක** මොනවා ද?



(i) ......................................

(ii) ......................................

**22.** (i) මෙම රූපයේ අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



:..............................

(ii) $\frac{3}{5}$, $\frac{1}{2}$, 0.3, $\frac{7}{10}$ යන සංඛ්‍යා අතුරෙන් **කුඩා ම** සංඛ්‍යාව කුමක් ද?

:..............................

**23.** පසිඳු පස්වරු 1.15ට තමාගේ නිවසින් පිටත් වී පස්වරු 2.40ට පුස්තකාලයට ළඟා විය.

(i) නිවසේ සිට පුස්තකාලයට යාමට පසිඳුට ගත වූ කාලය පැය හා මිනිත්තුවලින් කොපමණ ද?

: පැය ............... මිනිත්තු ...............

(ii) පසිඳු පුස්තකාලයට ළඟා වන විට වේලාව, පැය විසිහතරේ ඔරලෝසුවෙන් දැක්වෙන ආකාරයට ඉලක්කමෙන් ලියා දක්වන්න. .........................................

**24.**




මෙම රූපයේ දැක්වෙන කම්බි රාමුවේ,

(i) a, b, c හා d ලෙස නම් කර ඇති කම්බි කුරු හතරේ මුළු දිග සෙන්ටිමීටර කීය ද? ...............................

(ii) කම්බි රාමුවේ පරිමිතිය සෙන්ටිමීටර කීය ද? ..........................

**25.** භාජනයක අල්ලන මී පැණි පරිමාව ලීටර 3කි. එහි ලීටර 1 මිලිලීටර 800 ක ප්‍රමාණයක් මී පැණිවලින් පුරවා ඇත.

(i) මෙම භාජනය සම්පූර්ණයෙන් පිරවීම සඳහා තවත් අවශ්‍ය වන මී පැණි ප්‍රමාණය ලීටර හා මිලිලීටරවලින් කොපමණ ද?

ලීටර ............... මිලිලීටර ..................

(ii) භාජනයේ දැනට ඇති මී පැණි ප්‍රමාණයෙන් ධාරිතාව මිලිලීටර 150 බැගින් වූ බෝතල් කීයක් පිරවිය හැකි ද?

..................................................

**26.** එක්තරා වෙළෙඳසැලකින් සීනි කිලෝග්රෑම් 1 ග්රෑම් 750 ක් මිලදී ගැනීම සඳහා නිපුනි ගෙවූ මුදල රුපියල් 210කි. එම මුදල ගෙවීම සඳහා රුපියල් 500 නෝට්ටුවක් දුන් නිපුනිට ඉතිරි මුදල වශයෙන් ලැබුණේ එකම වර්ගයේ නෝට්ටු 5ක් හා එකම වර්ගයේ කාසි 4කි.

(i) මෙම වෙළෙඳසැලේ සීනි කිලෝග්රෑම් 1ක මිල රුපියල් කීය ද? : ...............................

(ii) ඉතිරි මුදල වශයෙන් නිපුනිට ලැබුණු,

(අ) නෝට්ටු පහේ මුළු වටිනාකම රුපියල් කීය ද? : ...............................

(ආ) කාසි හතරේ මුළු වටිනාකම රුපියල් කීය ද? : ...............................

**27.** 


මෙම ගණක රාමුවේ,

(i) නිරූපණය කරන සංඛ්යාව ඉලක්කමෙන් ලියන්න. ...............................

(ii) C කූරේ ඇති මුදු මගින් නිරූපණය කරන අගය කීය ද? ...............................

**28.** කුමුදු එක්තරා ස්ථානයකින් ගමන් ආරම්භ කර මීටර 100ක් නැගෙනහිර දිශාවට ගමන් කරයි. අනතුරුව රූපයේ දැක්වෙන ආකාරයට එතැනින් දකුණු අත පැත්තට හැරී තවත් මීටර 100ක් ගමන් කරයි.




(i) කුමුදු දැන් සිටින්නේ ආරම්භක ස්ථානයේ සිට කුමන දිශාවෙන් ද?...............................

(ii) නැවතත් ආරම්භක ස්ථානයට ම යාමට නම්, තවත් අවස්ථා කීයකදී දකුණු අත පැත්තට හැරී මීටර 100ක් බැගින් ඉදිරියට ගමන් කළ යුතු ද? ...............................

**29.** ගෙඩි 120ක් තිබුණු අඹ ගොඩකින් $\frac{3}{8}$ ක් නරක් වූ නිසා ඉවත් කරන ලදී. ඉතිරි හොඳ අඹ ගෙඩි සංඛ්යාව, පාලිකා, ශාලිකා හා නාලිකා යන මිතුරියන් තිදෙනා අතර සමානව බෙදන ලදී.

(i) ගොඩේ තිබුණු හොඳ අඹ ගෙඩි සංඛ්යාව කීය ද? : ...............................

(ii) එක් මිතුරියකට ලැබුණු අඹ ගෙඩි සංඛ්යාව කීය ද? : ...............................

**30.** A, B, C, D හා E ලෙස නම් කර ඇති හැඩතල පහක් පහත රූපයේ දැක්වේ.




මෙම හැඩතල අතුරෙන්,

(i) සමමිතික රේඛා **අඩු ම** සංඛ්යාවක් ඇඳිය හැකි හැඩතලයට අදාළ ඉංග්රීසි අක්ෂරය කුමක් ද? : ...............................

(ii) සමමිතික රේඛා **වැඩි ම** සංඛ්යාවක් ඇඳිය හැකි හැඩතලයට අදාළ ඉංග්රීසි අක්ෂරය කුමක් ද? : ...............................

[හත්වැනි පිටුව බලන්න.

- ප්‍රශ්න අංක **31** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරාගෙන **රව යටින් ඉරක් අඳින්න.**

**31.** වියළාගත් මල් තැම්බීමෙන් ඖෂධීය පානයක් පිළියෙල කිරීමට යොදා ගනු ලබන ශාකයකි.
(1) රණවරා (2) කෝපි (3) කොත්තමල්ලි (4) තේ

**32.** කුඹුරු ගොවිතැනේදී භාවිත කරනු ලබන උපකරණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) උදැල්ල, සකපෝරුව, වියගහ (2) වියගහ, දැකැත්ත, නගුල
(3) නගුල, සෙක්කුව, දැති පෝරුව (4) අතංගුව, උදැල්ල, දැකැත්ත

**33.** ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළක් පිහිටන පළාතකි.
(1) සබරගමු පළාත (2) මධ්‍යම පළාත (3) ඌව පළාත (4) වයඹ පළාත

**34.** විද්‍යුත් චුම්බකයක් භාවිත කෙරෙන නිර්මාණයකි.
(1) හුමාල බෝට්ටුව (2) සුළං දිශා දර්ශකය (3) විදුලි සීනුව (4) සිඳුරු කැමරාව

**35.** ජලයේ දැකිය හැකි ලක්ෂණයක් **නො වන්නේ,**
(1) නිශ්චිත හැඩයක් තිබීම ය. (2) රත් කිරීමේදී හුමාලය පිටවීම ය.
(3) කොන්ඩිස් කුඩු මගින් වර්ණ ගැන්වීම ය. (4) සිසිල් කළ විට අයිස් බවට පත්වීම ය.

**36.** අමුවෙන් කපාගත් කැබලි කිහිපයක් දැමීමෙන් භාජනයක ඇති ජලය වර්ණ ගැන්විය හැකි එළවළු වර්ගයකි.
(1) වම්බටු (2) වට්ටක්කා (3) කැරට් (4) බීට්රූට්

**37.** ඉහළ අහසේ පියාසර කරන තියුණු ඇස් යුගලක් සහිත මාංශභක්ෂක පක්ෂියෙකි.
(1) ඇටිකුකුළා (2) උකුස්සා (3) බකමූණා (4) වැහිලිහිණියා

**38.** සුළඟ මගින් වැඩි වශයෙන් පාංශු ඛාදනයට ලක් වන්නේ,
(1) උස් ශාක සහිත වනාන්තර ප්‍රදේශ ය. (2) ගොඩනැගිලි බහුල නාගරික ප්‍රදේශ ය.
(3) තණ කොළ නොමැති වැලි සහිත ප්‍රදේශ ය. (4) තේ පඳුරු සහිත කඳුකර ප්‍රදේශ ය.

**39.** පහත සඳහන් තරු රටා අතුරෙන් වැඩිම තරු සංඛ්‍යාවක් අයත් වන තරු රටාව කුමක් ද?
(1) දඩයක්කාරයා (2) මහවලහා (3) දකුණු කුරුසිය (4) ගෝනුස්සා

**40.** "ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට – කන්නේ කරවලයි රට හාලේ බතට" යන කවිය,
(1) ගොයම් කවියකි. (2) කරත්ත කවියකි. (3) පාරු කවියකි. (4) පතල් කවියකි.

**41.** නෝට්ටු මුහුණතේ නොරොච්චෝලෙයි විදුලි බලාගාරය දැක්වෙන ශ්‍රී ලංකා මුදල් නෝට්ටුව,
(1) රුපියල් 20 වේ. (2) රුපියල් 50 වේ. (3) රුපියල් 100 වේ. (4) රුපියල් 500 වේ.

**42.** ශ්‍රී ලංකාවට වඩාත් ආසන්නව පිහිටා ඇති රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) මාලදිවයින, නේපාලය, භූතානය (2) පාකිස්ථානය, ජපානය, බංග්ලාදේශය
(3) ඉන්දියාව, රුසියාව, නේපාලය (4) බංග්ලාදේශය, චීනය, මාලදිවයින

**43.** කෘත්‍රිම වර්ණක හා රසකාරක යොදන ලද ආහාර භාවිතයෙන් ඇති විය හැකි රෝගයකි.
(1) ජලභීතිකාව (2) පිළිකා (3) උණසන්නිපාතය (4) දියවැඩියාව

**44.** ඩෙංගු රෝගයෙන් ආරක්ෂා වීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයකි.
(1) උණු කර නිවාගත් ජලය පානය කිරීම (2) පිසූ ආහාර හොඳින් වසා තැබීම
(3) අවට පරිසරය පිරිසිදු කිරීම (4) එළවළු වැඩිපුර ආහාරයට ගැනීම

**45.** අපේ රටේ පොදු ප්‍රවාහන බස් රථයක පූජ්‍ය පක්ෂයට හැරුණු විට මගී ආසන වෙන්කර ඇති අනෙක් පුද්ගල කාණ්ඩ **දෙක** මොනවා ද?
(1) ළදරුවන්, රෝගීන් (2) රෝගීන්, පාසල් සිසුන්
(3) ආබාධිතයින්, ගැබිනි මව්වරුන් (4) වයස්ගත වැඩිහිටියන්, ආබාධිතයින්

[අටවැනි පිටුව බලන්න.

**46.** තවාන්වලින් පැළ ලබාගෙන පාත්තිවල සිටුවනු ලබන බෝග වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) බෝංචි, බණ්ඩක්කා, නිවිති (2) බෝංචි, තක්කාලි, මාළුමිරිස්
(3) වම්බටු, නිවිති, තක්කාලි (4) මාළුමිරිස්, වම්බටු, තක්කාලි

**47.** මාර්ග වර්ණ සංඥා පුවරුවක ඉහළ සිට පහළට වර්ණ සංඥා පිහිටන නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.
(1) රතු, කහ, කොළ (2) කොළ, කහ, රතු
(3) කහ, රතු, කොළ (4) කහ, කොළ, රතු

**48.** 'මයිනහම' භාවිත කරන්නේ,
(1) වඩුවා ය. (2) ධීවරයා ය. (3) පෙදරේරුවා ය. (4) කම්මල්කරුවා ය.

**49.** සුළඟ ආධාරයෙන් ක්‍රියා කරන සංගීත භාණ්ඩයකි.
(1) බුම්මැඩිය (2) හොරණෑව (3) දවුල (4) උඩැක්කිය

**50.** ශ්‍රී ලංකාවේ සෑම රජයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවකටම නොමිලයේ රජයෙන් ලබා දෙන්නේ,
(1) නිල ඇඳුම් හා දිවා ආහාර ය. (2) දිවා ආහාර හා පෙළපොත් ය.
(3) පෙළපොත් හා නිල ඇඳුම් ය. (4) ශිෂ්‍යාධාර හා දිවා ආහාර ය.

**51.** පිපිරී ඇට වැටීමෙන් ව්‍යාප්ත වන බීජ සහිත ශාකයකි.
(1) බඩ ඉරිඟු (2) හොර (3) පුවක් (4) මදටිය

**52.** පිටිය මැද සවිකරන ලද දැලක දෙපැත්තේ සිට කරනු ලබන ක්‍රීඩා **දෙකකි**.
(1) නෙට්බෝල්, බැඩ්මින්ටන් (2) වොලිබෝල්, බැඩ්මින්ටන්
(3) නෙට්බෝල්, බාස්කට්බෝල් (4) වොලිබෝල්, නෙට්බෝල්

**53.** කුරුටු ගී හා බිතු සිතුවම් දක්නට ලැබෙන ඓතිහාසික ස්ථානයකි.
(1) සීගිරිය (2) යාපහුව (3) ඉසුරුමුණිය (4) ඇම්බැක්ක

**54.** නිවසක් තුළට ස්වාභාවිකව සිසිල් සුළං ලබා ගැනීමට භාවිත කරනු ලබන ක්‍රමයක් **නො වන්නේ**,
(1) නිවෙස්වලට ජනෙල් සවි කිරීම ය. (2) විදුලි පංකා භාවිත කිරීම ය.
(3) බිත්තියේ ඉහළින් වා කවුළු තැබීම ය. (4) දොර උළුවස්සේ ඉහළ බීරළු සවි කිරීම ය.

**55.** ශාකවලට හානි කරන සතුන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දිමියා, කුහුඹුවා, මී මැස්සා (2) කැරපොත්තා, ගෙමැස්සා, මකුණා
(3) පුරුක් පණුවා, කුඩිත්තා, පිටිමකුණා (4) මකුණා, උකුණා, කිනිතුල්ලා

**56.** පහත සඳහන් ආහාර ද්‍රව්‍ය අතුරෙන් නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය අතර අඩු ම කාලයක් ඇත්තේ කුමකට ද?
(1) ටින් මාළු (2) යෝගට් (3) ජෑම් (4) චීස්

**57.** පිටරට වෙසෙන ඔබගේ පැනේ මිතුරෙකු දළදා පෙරහැරේ පින්තූරයක් හැකි ඉක්මනින් එවන ලෙස ඔබගෙන් ඉල්ලීමක් කරයි. මේ සඳහා ඔබට යොදා ගත හැකි වඩාත් ම සුදුසු ක්‍රමය මේවායින් කුමක් ද?
(1) ගුවන් තැපැල (2) මුහුදු තැපැල (3) ශීඝ්‍රගාමී තැපැල (4) විද්‍යුත් තැපැල

**58.** ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වශයෙන් වලිකුකුළා තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වන්නේ,
(1) මෙරට බහුලව සිටීම ය. (2) මෙරටට ආවේණික වීම ය.
(3) සෑම ප්‍රදේශයකම දක්නට ලැබීම ය. (4) වඩාත් ප්‍රයෝජනවත් වීම ය.

**59.** අතීතයේ දී අපේ රට යටත් කර ගෙන සිටි විදේශීය ජාතීන් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පෘතුගීසීන්, ලන්දේසීන්, ඉංග්‍රීසීන් (2) ලන්දේසීන්, පෘතුගීසීන්, ඉංග්‍රීසීන්
(3) ඉංග්‍රීසීන්, පෘතුගීසීන්, ලන්දේසීන් (4) පෘතුගීසීන්, ඉංග්‍රීසීන්, ලන්දේසීන්

**60.** "යුතුකම් ඉටු කරන්නට හා පුංචි පුංචි වගකීම් දරන්නට මගේ හිතේ ඇති වුණු උනන්දුව මගේ පවුලේ හැමෝගේම සිත්වලත් ඇති වේවා!" මෙම සිතුවිල්ල සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමක කුමන පියවරට අයත් වේ ද?
(1) මානසික ලිහිල් බව (2) අධිෂ්ඨානය (3) ප්‍රාර්ථනාව (4) උදානය

* * *

# 2017 අගෝස්තු

## I - පත්‍රය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1. (2) | 2. (1) | 3. (3) | 4. (1) | 5. (1) | 6. (2) | 7. (3) | 8. (1) | 9. (2) |
| 10. (3) | 11. (1) | 12. (2) | 13. (3) | 14. (2) | 15. (1) | 16. (3) | 17. (1) | 18. (3) |
| 19. (1) | 20. (2) | 21. (3) | 22. (1) | 23. (2) | 24. (2) | 25. (3) | 26. (2) | 27. (1) |
| 28. (2) | 29. (3) | 30. (1) | 31. (3) | 32. (3) | 33. (2) | 34. (1) | 35. (3) | 36. (1) |
| 37. (3) | 38. (2) | 39. (2) | 40. (2) | | | | | |

<u>ලකුණු දීමේ පිළිවෙළ :-</u> එක් ප්‍රශ්නයකට ලකුණු 2½ බැගින් මුළු ලකුණු 100 යි.

## II - පත්‍රය

**1.** (i) වීදුරු ඉලත්තට්ටුවක මතුයෙහි (ii) දී කිරි මතක් කළ බැවිනි (iii) සුදු බොකුටු (iv) නුපුළුවන් (v) නොවී ය. / නොවී (vi) සිහසුන අරා හිඳගත් කුමාරයකු මෙන් **2.** (i) පලතුරු (ii) වනයට **3.** (i) ✓ (ii) × (iii) ✓ (iv) × **4.** (i) ධාරානිපාත වර්ෂාවකට (ii) නොඉවසිල්ලෙන් **5.** (i) හාස්‍යජනක (ii) වඳුරකුගේ **6.** කරුණා ගුණයේ සාරය සොයලා **7.** යහළුවා **8.** අපොයි! දෙවියනේ! මේ අවනඩුව කාට කියන්නද ? **9.** මුළු දවස නිති වෙහෙසෙති **10.** කනයා පණ්ඩිතයා ලු **11.** (i) tomorrow (ii) rainbow **12.** (i) post office (ii) market **13.** I am hungry **14.** ආපන ශාලාව **15.** නාන් පඩික්කිරේන්
**16.** (i) හිරු නැගෙනවාත් සමග පිබිදෙන සුවඳැති මල් නිසා උද්‍යාන ඉතා සුන්දර වේ.
(ii) දසතින් ඇසෙන කුරුල්ලන්ගේ කිචි බිචි නාදය නිසා උද්‍යාන සුන්දර වේ.
(iii) ළමයින් කොක් රැනක් සේ සුදු ඇඳුමින් සැරසී පාසල කරා යන විට උද්‍යාන තව තවත් සුන්දර වේ.
**17.** 30100 **18.** 675 **19.** xviii **20.** $\frac{5}{10}$ හෝ $\frac{1}{2}$ **21.** (i) චතුස්තලය (ii) සිලින්ඩරය **22.** (i) 0.2 (ii) 0.3 **23.** (i) පැය 01 මිනිත්තු 25 (ii) පැය 14:40 **24.** (i) 80 cm (ii) 160 cm **25.** (i) ලීටර 1 මිලිලීටර 200 (ii) 12 **26.** (i) රු. 120.00 (ii) (අ) රු. 250.00 (ආ) රු. 40.00 **27.** (i) 5234 (ii) 30 **28.** (i) ගිණිකොණ (ii) අවස්ථා 2 යි. **29.** (i) 75 (ii) 25 **30.** (i) A (ii) E **31.** (1) **32.** (2) **33.** (4) **34.** (3) **35.** (1) **36.** (4) **37.** (2) **38.** (3) **39.** (1) **40.** (4) **41.** (3) **42.** (1) **43.** (2) **44.** (3) **45.** (3) **46.** (4) **47.** (1) **48.** (4) **49.** (2) **50.** (3) **51.** (4) **52.** (2) **53.** (1) **54.** (2) **55.** (3) **56.** (2) **57.** (4) **58.** (2) **59.** (1) **60.** (3)

<u>ලකුණු දීමේ පිළිවෙළ :-</u> 1 ලකුණු (06) යි, 2 - 7 ලකුණු (12) යි, 8 - 10 ලකුණු (03) යි, 11 - 13 ලකුණු (05) යි, 14 - 15 ලකුණු (02) යි, 16 ලකුණු (06) යි, 17 - 23 ලකුණු (14) යි, 24 ලකුණු (03) යි, 25 ලකුණු (04) යි, 26 ලකුණු (04) යි, 27 ලකුණු (02) යි, 28 ලකුණු (02) යි, 29 ලකුණු (03) යි, 30 ලකුණු (02) යි, 31 - 60 ලකුණු (30) යි, පිරිසිදුකම හා පැහැදිලි බවට ලකුණු (02) යි, මුළු ලකුණු 100 යි.

2632

රහස්‍ය ලේඛනයකි.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

**පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට**

# පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

# 2017 අගෝස්තු

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස්

## සහ

## ලකුණු දීමේ පටිපාටිය

## II පත්‍රය




සියලු ම හිමිකම් ඇවිරිණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

(2 පිටුව බලන්න.

පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට
පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2017 අගෝස්තු

# II පත්‍රය

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

### 1. උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී සැලකිය යුතු කරුණු

1.1 සෑම ප්‍රශ්නයක ම නිවැරදි ප්‍රතිචාරයක් සඳහා "√" ලකුණ ද එයට හිමි ලකුණු ප්‍රමාණය ද වැරදි ප්‍රතිචාරයක් සඳහා "×"ලකුණ ද 00 ද පිටුවෙහි දකුණුපස තීරයෙහි පැහැදිලි ව සටහන් කරන්න.

1.2 එක් එක් පිටුවේ නිවැරදි පිළිතුරු සඳහා වූ ලකුණුවල එකතුව එම පිටුවේ දකුණුපස පහළ කෙළවරේ ඇති **කොටුව තුළ අංක දෙකකින් සටහන් කරන්න.**

1.3 එක් එක් පිටුවේ සටහන් කළ ලකුණුවල එකතුව මුල් පිටුවේ අදාළ පිටු අංකයට ඉදිරියෙන් ඇති කොටුව තුළ සටහන් කරන්න.

1.4 සමස්ත උත්තර පත්‍රය සලකා බලා අත් අකුරු සහ ඉලක්කම් පැහැදිලි ව සහ නිවැරදි ව ලියා ඇත්නම් අමතර ලකුණු 02 ක් ප්‍රදානය කරන්න. එසේ ම, අත් අකුරු අපැහැදිලි තත්ත්වයකින් තිබුණත් නිවැරදි ව ලියා ඇත්නම් ලකුණු 01 ක් ප්‍රදානය කරන්න. එම ලකුණු +02 හෝ +01 ලෙස පළමුවන පිටුවේත් අටවන පිටුවේත් ලකුණු තීරුවේ සටහන් කරන්න. ලකුණු නොදෙන්නේ නම් ලකුණු +00 ලෙස සටහන් කරන්න.

1.5 සියලු ම ලකුණුවල එකතුව අවසාන ලකුණ යටතේ ඉලක්කමෙන් සහ අකුරෙන් අදාළ කොටු තුළ ලියන්න.

### 2. ලකුණු පටිපාටිය පිළිබඳ කෙටි විස්තරයක්

2.1 ප්‍රශ්න අංක **1** සිට **15** තෙක් ප්‍රශ්නවල සියලු ම කොටස්වල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න.

2.2 ප්‍රශ්න අංක **16** සඳහා (වගන්ති) එක් වගන්තියකට ලකුණු 02 බැගින් ප්‍රදානය කරන්න.

2.3 ප්‍රශ්න අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 02 බැගින් ප්‍රදානය කරන්න.

2.4 ප්‍රශ්න අංක **21** සිට **23** තෙක් ප්‍රශ්නවල (i) හා (ii) කොටස් සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න.

2.5 ප්‍රශ්න අංක **24** හි (i) කොටස සඳහා ලකුණු 02 ක් ද (ii) කොටස සඳහා ලකුණු 01 ක් ද ප්‍රදානය කරන්න.

2.6 ප්‍රශ්න අංක **25** හි (i) හා (ii) කොටස් සඳහා ලකුණු 02 බැගින් ප්‍රදානය කරන්න.

2.7 ප්‍රශ්න අංක **26** (i) කොටස සඳහා ලකුණු 02 ක් ද (ii) (අ), (ආ) කොටස් සඳහා ලකුණු 01 බැගින් ද ප්‍රදානය කරන්න.

2.8 ප්‍රශ්න **27** සහ **28** සඳහා එක් කොටසකට ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න.

2.9 ප්‍රශ්න අංක **29** (i) කොටස සඳහා ලකුණු 02 ක් ද (ii) කොටස සඳහා ලකුණු 01 ක් ද ප්‍රදානය කරන්න.

2.10 ප්‍රශ්න අංක **30** (i) හා (ii) කොටස් සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න.

2.11 ප්‍රශ්න අංක **31** සිට **60** තෙක් නිවැරදි පිළිතුර සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න.

2.12 ප්‍රශ්න අංක **1, 6, 7, 9, 10** පිළිතුරුවල අක්ෂර වින්‍යාසය නිවැරදිව තිබිය යුතුයි.

2.13 ප්‍රශ්න අංක **3** හි නිවැරදි වාක්‍ය සඳහා "√" ලකුණ ද වැරදි වාක්‍ය සඳහා "×" ලකුණ ද යොදා ඇත් නම් ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න.

2.14 ප්‍රශ්න අංක **4, 5** ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට **යටින් ඉරක් ගසා තිබිය යුතුයි.** නිවැරදි වචනය හිස්තැනෙහි ලියා තිබුණහොත් හෝ නිවැරදි වචනය ලියා ඉරි ගසා තිබුණහොත් හෝ ලකුණු නොලැබේ.

2.15 ප්‍රශ්න අංක **11, 13, 14, 15** පිළිතුරුවල සියලුම අකුරු නිවැරදි විය යුතුයි. ඉංග්‍රීසි වාක්‍යයේ කැපිටල් සිම්පල් මිශ්‍රව ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න.

2.16 ප්‍රශ්න අංක **12** උපුටා ගැනීමක් නිසා එලෙසම තිබිය යුතුවේ.

(3 පිටුව බලන්න.

**3. ලකුණු ලැයිස්තු සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු**

3.1 ලකුණු ලැයිස්තුවේ "ලකුණු එකතුව II පත්‍රය" තීරුවේ 100 ලෙසට සටහන් කරන්න.

3.2 එක් එක් අපේක්ෂකයාගේ විභාග අංකය ඉදිරියේ, ඊට නියමිත උත්තර පත්‍රයේ සඳහන් අවසාන ලකුණ "ලකුණු එකතුව II පත්‍රය" තීරුවේ සටහන් කරන්න.

3.3 අවසාන ලකුණ ඉදිරියෙන් තීරු දෙකක් ඉතිරි කර, එම ලකුණ පැහැදිලි ව අකුරෙන් ලියන්න.

3.4 ලකුණු ඇතුළත් කිරීමේ දී යම් වරදක් සිදුවුවහොත්, පැහැදිලි ව **තනි ඉරකින් කපා** ඉදිරියෙන් ඇති තීරුවේ ලියා සම්පූර්ණ අත්සන යොදන්න.

3.5 කිසියම් සංශෝධනයක් කරනු ලැබුවහොත්, පළමුවන හා දෙවන පරීක්ෂකවරුන්ගේ සම්පූර්ණ අත්සන යොදා එය සනාථ කරන්න.

3.6 සංශෝධනයක් කරනු ලබන සෑම අවස්ථාවක දී ම ලකුණු ලැයිස්තුවත් පිළිතුරු පත්‍රයත් ප්‍රධාන පරීක්ෂකට පෙන්වා ඔහුගේ/ඇයගේ අත්සන ද ලබා ගන්න.

3.7 සෑම සංශෝධනයක් ම, ලකුණු ලැයිස්තුවේ පසුපිටෙහි "වෙනත් කරුණු" සඳහා වෙන් ව ඇති ස්ථානයේ ද සටහන් කර සම්පූර්ණ කරන්න.

3.8 සෑම ලකුණු ලැයිස්තුවක් ම ලකුණු ඇතුළත් කළ පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කළ පරීක්ෂක (EMF) සහ ප්‍රධාන පරීක්ෂක විසින් ස්වකීය සංකේත අංක සහ අත්සන් යොදා සහතික කර තිබීම අනිවාර්ය වේ.

**පිළිතුරු පත් ලකුණු කිරීමේදීත්, ලකුණු ලැයිස්තු පිළියෙල කිරීමේදීත්, පිරිසිදුවත්, පැහැදිලි ලෙසටත්, සම්මත ආකාරයටත් කටයුතු කිරීමට සැලකිලිමත් විය යුතු ය.**

**උත්තර පත්‍රයක හෝ ලකුණු ලැයිස්තුවක හෝ යම් වෙනසක් සිදු කරන්නේ නම් එය පළමු පරීක්ෂක විසින් ම සිදු කළ යුතු ය. නමුත් ඒ සියල්ල ප්‍රධාන පරීක්ෂකගේ අනුමැතිය ඇතිව කළ බවට ප්‍රධාන පරීක්ෂකගේ අත්සන ද යෙදිය යුතු අතර ගණිත පරීක්ෂක හා උත්තර පත්‍රය පරීක්ෂා කළ දෙවන පරීක්ෂක ද කෙටි අත්සන යෙදිය යුතු ය.**

(4 පිටුව බලන්න.

## II පත්‍රය

ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංක | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 1 | (i) | වීදුරු ඉලත්තට්ටුවක මතුයෙහි /වීදුරු ඉලත්තට්ටුවක | 01 |
| | (ii) | දීකිරි මතක් කළ බැවිනි | 01 |
| | (iii) | සුදු බොකුටු | 01 |
| | (iv) | නුපුළුවන් | 01 |
| | (v) | නොවී ය / නොවී | 01 |
| | (vi) | සිහසුන අරා හිඳගත් කුමාරයකු මෙන් | 01 |
| 2 | (i) | පලතුරු | 01 |
| | (ii) | වනයට | 01 |
| 3 | (i) | (√) | 01 |
| | (ii) | (×) | 01 |
| | (iii) | (√) | 01 |
| | (iv) | (×) | 01 |
| 4 | (i) | ධාරානිපාත වර්ෂාවකට | 01 |
| | (ii) | නොඉවසිල්ලෙන් | 01 |
| 5 | (i) | හාස්‍යජනක | 01 |
| | (ii) | වඳුරකුගේ | 01 |
| 6 | | කරුණා ගුණයේ සාරය සොයලා | 01 |
| 7 | | යහළුවා / යාළුවා | 01 |
| 8 | | අපොයි ! දෙවියනේ ! මේ අවනඩුව කාට කියන්නද?<br>(විරාම ලකුණු තුනෙන් දෙකක් තිබුණ ද ලකුණු හිමි වේ.) | 01 |
| 9 | | මුළු දවස නිති වෙහෙසෙති (දීර්ඝ ඉස්පිල්ල තිබිය යුතුයි.) | 01 |
| 10 | | කතයා පණ්ඩිතයා වූ (වූ නිපාතය ඇත් කර තිබිය යුතුයි.) | 01 |
| 11 | (i) | Tomorrow / tomorrow / TOMORROW | 01 |
| | (ii) | Rainbow / rainbow / RAINBOW<br>(කැපිටල් සිම්පල් අකුරු මිශ්‍ර කර තිබුණත් ලකුණු දෙන්න.) | 01 |
| 12 | (i) | post office (උපුටා ගැනීමක් නිසා එලෙසම තිබිය යුතුයි.) | 01 |
| | (ii) | market (උපුටා ගැනීමක් නිසා එලෙසම තිබිය යුතුයි.) | 01 |
| 13 | | I am hungry / I'm hungry (කැපිටල් සිම්පල් අකුරු මිශ්‍ර කර තිබුණත් ලකුණු දෙන්න.) | 01 |
| 14 | | ආපනශාලාව / ආපණශාලාව / අවන්හල | 01 |
| 15 | | නාන් පඩික්කිරේන් / නාන් පාඩම් පඩික්කිරේන් / නාන් පඩික්කින්රේන් / නාන් පාඩම් පඩික්කින්රේන් | 01 |

( 5 පිටුව බලන්න.

| | | |
|---|---|---|
| 16 | නිවැරදි වාක්‍ය 03 සඳහා ලකුණු 02 × 03<br>**එක් නිවැරදි වැකියකට ලකුණු 02 බැගින් ලැබේ.**<br>❊ දී ඇති මාතෘකාවට අනුව ලියන ලද වැකි විය යුතු ය.<br>❊ උක්ත-ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.<br>❊ ලිඛිත භාෂාවෙන් ලියන ලද වැකි විය යුතු ය.<br>❊ වැකියක වචන ගණන පහට වැඩි විය යුතු ය. (අවමය වචන හයකි.)<br>❊ අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.<br>❊ වැකියේ අදහස නිවැරදි විය යුතු ය.<br>❊ මාතෘකාවේ සඳහන් කොටස් නැවත නැවත ලිවීම හෝ එක ම අදහස නැවත නැවත ලිවීම සිදු නොවිය යුතු ය.<br>❊ මාතෘකාවට දී ඇති වාක්‍යය ම උපුටා ලියා ඇත්නම් ලකුණු දෙනු නොලැබේ.<br>❊ මාතෘකාවේ සඳහන් වචන කිහිපයක් හා වෙනත් වචන ගනිමින් නිර්මාණශීලී වාක්‍යයක් ගොඩනගා ඇත්නම් ලකුණු දෙනු ලැබේ.<br>❊ **වැකියකට එක් ලකුණක් පමණක් ප්‍රදානය කිරීම පිළිබඳ ව උපදෙස්**<br>වැකියේ එක් වචනයක අකුරක අඩුපාඩුවක් හෝ පිල්ලමක අඩුවක් හෝ වේ නම් ලකුණු 01 කි. (එකට වැඩි අඩුපාඩු වේ නම් ලකුණු නොලැබේ)<br>❊ වැකි තුනකට වඩා ලියා ඇත්නම් මුල් වැකි 03 (තුන) පමණක් ලකුණු කරන්න. (වැඩිපුර ලියා ඇත්නම් වාක්‍ය රතු පාටින් ඉරකින් කපා හරින්න.) | 06 |
| 17 | 30100 / 30 100 | 02 |
| 18 | 675 | 02 |
| 19 | XVIII / xviii | 02 |
| 20 | $\frac{5}{10}$ හෝ $\frac{1}{2}$ | 02 |
| 21 | (i) සිලින්ඩරය / චතුස්තලය<br>(ii) චතුස්තලය / සිලින්ඩරය | 01<br>01 |
| 22 | (i) 0.2<br>(ii) 0.3 | 01<br>01 |
| 23 | (i) පැය 1 මිනිත්තු 25<br>(ii) 14 : 40 / 14 40 / පැය 14 : 40 / 1440 h | 01<br>01 |
| 24 | (i) 80 / 80 cm / සෙ. මී. 80<br>(ii) 160 / 160 cm / සෙ. මී. 160 | 02<br>01 |
| 25 | (i) ලීටර 1 මිලිලීටර 200<br>(ii) 12 / දොළහයි | 02<br>02 |
| 26 | (i) 120 / 120.00 / රු. 120.00 / 120/= / රු. 120/=<br>(ii) (අ) 250 / 250.00 / රු. 250.00 / 250/= / රු. 250/=<br>(ආ) 40 / 40.00 / රු. 40.00 / 40/= / රු. 40/= | 02<br>01<br>01 |
| 27 | (i) 5234 / 5 234<br>(ii) 30 | 01<br>01 |

( 6 පිටුව බලන්න.

| | | |
|---|---|---|
| 28 | (i) ගිණිකොණ / ගිණිකොණ දිශාවෙන්<br>(ii) දෙකයි / 2යි / 2 / දෙවරක් | 01<br>01 |
| 29 | (i) 75<br>(ii) 25 | 02<br>01 |
| 30 | (i) A<br>(ii) E | 01<br>01 |
| 31 | (1) රණවරා | 01 |
| 32 | (2) වියගහ, ඇකැත්ත, නගුල | 01 |
| 33 | (4) වයඹ පළාත | 01 |
| 34 | (3) විදුලි සීනුව | 01 |
| 35 | (1) නිශ්චිත හැඩයක් තිබීම ය. | 01 |
| 36 | (4) බීට්රූට් | 01 |
| 37 | (2) උකුස්සා | 01 |
| 38 | (3) තණ කොළ නොමැති වැලි සහිත ප්‍රදේශ ය. | 01 |
| 39 | (1) දඩයක්කාරයා | 01 |
| 40 | (4) පතල් කවියකි. | 01 |
| 41 | (3) රුපියල් 100 වේ. | 01 |
| 42 | (1) මාලදිවයින, නේපාලය, භූතානය | 01 |
| 43 | (2) පිළිකා | 01 |
| 44 | (3) අවට පරිසරය පිරිසිදු කිරීම | 01 |
| 45 | (3) ආබාධිතයින්, ගැබිනි මව්වරුන් | 01 |
| 46 | (4) මාළුමිරිස්, වම්බටු, තක්කාලි | 01 |
| 47 | (1) රතු, කහ, කොළ | 01 |
| 48 | (4) කම්මල්කරුවා ය. | 01 |
| 49 | (2) හොරණෑව | 01 |
| 50 | (3) පෙළපොත් හා නිල ඇඳුම් ය. | 01 |
| 51 | (4) මැදටිය | 01 |
| 52 | (2) වොලිබෝල්, බැඩ්මින්ටන් | 01 |
| 53 | (1) සීගිරිය | 01 |
| 54 | (2) විදුලි පංකා භාවිත කිරීම ය. | 01 |

( 7 පිටුව බලන්න.

| | | |
|---|---|---|
| **55** | (3) පුරුක් පණුවා, කුඩිත්තා, පිටිමකුණා | 01 |
| **56** | (2) යෝගට් | 01 |
| **57** | (4) විද්‍යුත් තැපෑල | 01 |
| **58** | (2) මෙරටට ආවේණික වීම ය. | 01 |
| **59** | (1) පෘතුගීසීන්, ලන්දේසීන්, ඉංග්‍රීසීන් | 01 |
| **60** | (3) ප්‍රාර්ථනාව | 01 |

# ළමයි ලියා ඇති නිවැරදි වාක්‍ය

01. ධවල පැහැගත් මීදුම අතරින් ගලනා හිරු රැස් නිසා උද්‍යාන අසිරිය වැඩි වේ.

02. පුංචි පුංචි මල් ලා හිරු රැසින් පිබිදෙනා විට උදයේ සුන්දරත්වය වැඩිවෙයි.

03. මල් පිපී ඇති විට හා ගස් වැලින් වෙළී ඇති විට උද්‍යානයේ ඇති සුන්දරත්වය දෙගුණ තෙගුණ වෙයි.

04. කුඩා ළමයි උද්‍යානින්ම කොත් රැනක් සේ යනා විට උද්‍යාන නව නවත් සුන්දර වේ.

05. උද්‍යාන ම ඇසෙනා කුරුල්ලන්ගේ කිචි බිචි නාදය නිසා උද්‍යාන සුන්දර වේ.

06. ළමයි කොත් රැනක් සේ සුදු ඇඳුමින් සැරසී පාසල කරා යනා විට උද්‍යාන නව නවත් සුන්-දර වේ.

07. හමා එන සිසිල් සුළඟ නිසා උද්‍යානයේ අලං-කාරය නව නවත් වැඩි වේ.

08. හිරු කඳු මුදුනින් නැගී එනා විට උද්‍යාන සුන්දරත්වය නව නවත් වැඩි වෙයි.

09. විහඟුන් අහසේ පියාඹනා නිසා උද්‍යාන නව නවත් සුන්දර වේ.

10. කුරුල්ලන්ගේ ගී රාවය ඇසී නැගිට සිප්හල වෙත යන කුඩා ළමුන් නිසා උද්‍යාන සුන්දරත්වය වැඩි වේ.

11. කුරුල්ලන්ගේ කිචි බිචි නාදය නිසා උදෑසන සුන්දරත්වය තව තවත් වැඩිවෙයි.

12. පරිසරයම මීදුමින් වැසී තිබෙන නිසා උදෑසන සුන්දරත්වය වැඩි වේ.

13. හිරු පැයෙනවාත් සමග පිපෙන සුවඳැති මල් නිසා උදෑසන ඉතා සුන්දර වේ.

14. මේ උදෑසන මල් පිපී ඇති විට උදෑසන සුන්ද-රත්වය තවත් අසිරිමත්ව පෙනේ.

15. උදලු රැගත් ගොවියන්ගේ දර්ශනය නිසා උදෑ-සන අසිරිය වැඩිවෙයි.

ළමයි ලියා ඇති වැරදි වාක්‍ය.

01. කඳු මුදුනින් ගිණිබෝලයක් සේ හිරු කුමරා නැග එන මේ උදෑසන සුන්දරයි.

02. කුරුල්ලන්ගේ කිචි බිචි නාදය උදෑසන නැත්රේ.

03. උදෑසනම අවදි වී ප්‍රබෝධමත් කමින් සුදු කොක්කු රෑනක් සේ ළමයි පාසල වෙත යති.

04. හිරු නැග එන උදෑසනෙ විල් පොකුණු වල පුෂ්පයෝ විකසිත වෙති

05. උදෑසනක අසිරිය විඳිමින් අප පාසල වෙත ළඟා වෙමු.

06. උදෑසන අහස කුරුල්ලෝ අලංකාර කරයි.

07. මල් පිපීමෙන් උදෑසනක අලංකාරය සුංදර කරයි.

08. කුරුල්ලෝ පැටවුන්ට ආහාර සොයා ඒමට පිණිස යති.

09. උදෑසන මල් පිපී පරිසරය අලංකාර කරයි.

10. කුඩා ළමුන් මල්මෙන් සැරසී පාසල් වෙත යයි.

11. පරිසරයේ තිබෙන ගස්වල හා වැල්වල පිපී තිබෙන මල් මුළු උද්‍යානයම සුවඳින් මත්කරයි

12. ගව පැටවුන්ගේ උම්බෑ හඬ නගයි.

13. සියලු පුෂ්ප පිපී පරිසරය සුවඳින් නාවයි.

14. හිරු කඳු අතරින් එබී බලන විට පුංචි පුංචි මල් පිපේ.

15. නැගෙනහිර අහසේ හිරු පායා සුන්දරවත් කරයි.

273573

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2016

**පාසල්වලට සිසුන් තෝරාගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2016 අගෝස්තු**

# I පත්‍රය

**මිනිත්තු 45 යි.**

**විභාග අංකය :** ...............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන එට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |

[දෙවැනි පිටුව බලන්න

- අංක 1 සහ 2 ප්‍රශ්නවල මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට, ගැළපෙන කොටස තෝරන්න.

**1.**





(1) (2) (3)

**2.**





(1) (2) (3)

**3.** පහත දී ඇති රූපවලින් එක් රූපයක් අනෙක් රූප දෙකට වඩා වෙනස් ය. එම වෙනස් රූපය තෝරන්න.



(1) (2) (3)

**4.** පහත දී ඇති රූපවලින් වක්‍ර රේඛා පමණක් ඇති රූපය තෝරන්න.



(1) (2) (3)

**5.** පහත දී ඇති සංඛ්‍යා හා ඒ වටා ඇඳ ඇති රූප අනුව 60 සංඛ්‍යාව වටා ඇඳිය යුතු රූපය කුමක් ද?




60



(1) (2) (3)

විභාග අංකය : ..............................

**6.** ආහාර ද්‍රව්‍ය ඇසුරුමක ලේබලයක කොටසක් පහත දී ඇත.

| | |
|---|---|
| ① → | 2016.01.07 |
| ② → | 2016.08.07 SS |

ලේබලයට අනුව, ① හා ② විය හැක්කේ පිළිවෙළින් මොනවා ද?

(1) නිෂ්පාදිත දිනය හා වෙළඳපොළට නිකුත් කළ දිනය
(2) වෙළඳපොළට නිකුත් කළ දිනය හා කල් ඉකුත්වීමේ දිනය
(3) නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය

● පහත දී ඇත්තේ සිගිති පොළක වෙළඳ කුටි සැලැස්මකි. ඒ ඇසුරෙන් අංක **7** සහ **8** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| සිගිති පොළ – 2016 | | | |
|---|---|---|---|
| ①<br>වියළි ආහාර ද්‍රව්‍ය | ②<br>එළවලු | ③<br>පලතුරු සහ පලා වර්ග | ④<br>මල් පැළ |

**7.** සීනි, ගොටු කොළ හා ඉදුණු කෙසෙල් මිල දී ගැනීමට යා යුතු වෙළඳ කුටිවල අංක මොනවා ද?

(1) ① හා ②　　(2) ① හා ③　　(3) ② හා ③

**8.** තරාදියක් භාවිත **නොකරන** කුටියක් වීමට වඩාත් ම ඉඩ ඇත්තේ කුමක් ද?

(1) ①　　(2) ③　　(3) ④

**9.** පහත දී ඇති වාක්‍යවලින් නිවැරදි ව ලියා ඇති වාක්‍යය තෝරන්න.

(1) අපි යුතුකම් ඉටු කරමු.
(2) අප යුතුකම් ඉටු කරමු.
(3) අපි යුතුකම් ඉටු කරමු.

**10.** 'කාර්යක්ෂමතාව' යන වචනයේ ඇති අකුරු කිහිපයකින් සෑදිය හැකි අර්ථවත් වචනයකි.

(1) වර්ෂය　　(2) කාමරය　　(3) තර්කය

**11.** පහත දී ඇති ඡේදය කියවන්න.

වනාන්තරය සතුන්ට රජදහනකි. මිනිස්සු වනසතුන් ⚠1 ආශා කළහ. මිනිසුන්ට එම අවස්ථාව ලබා දීමේ අරමුණින් වනාන්තරයෙන් අල්ලාගත් සතුන් කූඩු කර ප්‍රදර්ශනය කිරීම ආරම්භ කෙරිණි. ඒ සමග ම ලෝකයේ ⚠2 සංකල්පය බිහි විය.

ඡේදයේ ⚠1 සහ ⚠2 ස්ථානවලට වඩාත් සුදුසු වචන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) දැකීමට, වනෝද්‍යාන
(2) ඇල්ලීමට, සත්වෝද්‍යාන
(3) නැරඹීමට, සත්වෝද්‍යාන

● පහත දී ඇති රූප සටහන සලකා අංක **12** සහ **13** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**12.** $c$ හා $i$ අක්ෂරවලින් නිරූපණය කළ හැකි සතුන් දෙදෙනකු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) හාවා, උකුස්සා
(2) අළියා, වවුලා
(3) නරියා, කොකා

**13.** ඉහත රූප සටහන තුළ පිළිවෙළින්, සිංහයා හා කපුටා නිරූපණය කිරීමට යොදා ගත හැකි අක්ෂර යුගලයක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) $d, f$ (2) $g, m$ (3) $h, g$

**14.** ශ්‍රී ලංකාවට නිදහස ලැබුණේ කුමන සියවසේ කුමන දශකයේ ද?

(1) 19 වන සියවසේ 5 වන දශකයේ
(2) 20 වන සියවසේ 4 වන දශකයේ
(3) 20 වන සියවසේ 5 වන දශකයේ

**15.** 2000.05.01 දින ශ්‍රී ලංකාවේ උපත ලැබූ අයකු 2016.06.01 දිනය වන විට සූර්යයා වටා ගමන් කර ඇති සම්පූර්ණ වට ගණන කීය ද?

(1) 10 (2) 16 (3) 17

**16.** පාසලක එක්තරා උත්සවයක් ආරම්භයේ දී ඉටිපන්දම් 9 ක් දැල්වීමට සූදානම් කර ඇත. එක් ඉටිපන්දමක් දැල්වී තිබෙන කාලය මිනිත්තු 30 කි. ඉටිපන්දම් 9 එකවර දැල්වුවහොත් ඒ සියල්ල ම දැල්වී තිබෙන කාලය කොපමණ ද?

(1) මිනිත්තු 30 යි
(2) මිනිත්තු 270 යි
(3) මිනිත්තු 300 යි

**17.** රජයේ පාසලක පළමු වාර පරීක්ෂණය ආරම්භ වූයේ මාර්තු 18 වැනි බ්‍රහස්පතින්දා ය. මාර්තු 23 වැනි දා ප්‍රසිද්ධ නිවාඩු දිනයකි. වාර පරීක්ෂණය දින 6 ක් පැවැත්වුණි. වාර පරීක්ෂණය අවසන් වූ දවස කවදා ද?

(1) සඳුදා
(2) බ්‍රහස්පතින්දා
(3) සිකුරාදා

- අංක **18** සහ **19** ප්‍රශ්නවල රටාව අනුව ඊළඟට ආ යුතු රූපය තෝරන්න.

**18.**





(1) (2) (3)

**19.**





(1) (2) (3)

**20.** නිරෝගී ඇත් රංචුවක සිටින ඇතුන්ගේ දළ සංඛ්‍යාවේත් පාද සංඛ්‍යාවේත් එකතුව 132 කි. එම රංචුවේ සිටින මුළු ඇතුන් සංඛ්‍යාව කීය ද?

(1) 22 (2) 33 (3) 66

- පහත දී ඇති පුවත්පත් වාර්තාව කියවා අංක **21** සහ **22** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි එක ම වැසි වනාන්තරය වන මොරඇල්ල වනාන්තරය, අනවසර දැව කැපීම, වගාවන් සඳහා එළිපෙහෙළි කිරීම, කුඩා විදුලිබලාගාර ඉදිකිරීම වැනි තත්ත්ව යටතේ දැඩි පාරිසරික අනතුරකට ලක් වී තිබේ. මහවැලි ගඟ ඇතුළු ගංගාවන් රැසක් පෝෂණය කරන මෙම වනාන්තරයෙහි ශාක විශේෂ 192 ක් පමණ හඳුනා ගෙන ඇති අතර එයින් 92 ක් පමණ ශ්‍රී ලංකාවට ආවේණික ශාක ලෙස සැලකේ. එයින් ද ශාක විශේෂ 21ක් මේ වන විට තර්ජනයට ලක් වී ඇත.

(2015.11.09 දින පුවත්පත පළ වූ ලිපියක් ඇසුරෙනි.)

**21.** මොරඇල්ල වනාන්තරය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ

(1) මධ්‍යම පළාතේ ය. (2) ඌව පළාතේ ය. (3) සබරගමුව පළාතේ ය.

**22.** මෙම පුවත්පත් වාර්තාව සඳහා වඩාත් සුදුසු ශීර්ෂ පාඨයක් (මාතෘකාවක්) වන්නේ පහත සවරක් ද?

(1) මොරඇල්ල වනාන්තරය වගාවන් සඳහා එළිපෙහෙළි කෙරේ.
(2) මොරඇල්ල වනාන්තරය පාරිසරික අනතුරකට ලක් වී ඇත.
(3) මොරඇල්ල වනාන්තරයේ ශාක විශේෂ හඳුනා ගැනේ.

**23.** A, B, C හා D යන එක් එක් ත්‍රිකෝණය තුළ ඇති විශාල ම ඉලක්කම භාවිත කර සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව කුමක් ද?

(1) 9 765

(2) 5 679

(3) 2 348




**24.** මෙහි දී ඇති සටහනේ සංඛ්‍යා පිහිටන්නේ යම් කිසි රටාවකට අනුවයි. එම රටාව අනුව ◌ තිබෙන තැනට තිබිය යුතු සංඛ්‍යාව කීය ද?




(1) 24 (2) 12 (3) 6

**25.** පහත සඳහන් රූපවල ඇති සංඛ්‍යා රටාව අනුව හිස්තැනට තිබිය යුතු සංඛ්‍යාව තෝරන්න.




(1) 9 (2) 6 (3) 4

**26.** සමචතුරස්‍රයක හැඩය ඇති කඩදාසියක් (1) රූපයේ දැක්වේ. එහි හරි මැද වෘත්තාකාර සිදුරක් ඇත. (2) රූපයේ දැක්වෙන කඩඉරි දිගේ කඩදාසිය දෙවරක් නවනු ලැබේ. ඉන්පසු (3) රූපයේ දැක්වෙන පරිදි දෙවැනියට නවන ලද දාරයේ ඉහළින් කුඩා කොටසක් කපා ඉවත් කරනු ලැබේ.



(1) රූපය (2) රූපය (3) රූපය

කඩදාසිය සම්පූර්ණයෙන් ම දිගහැරිය විට දැකිය හැකි මුළු සිදුරු ගණන කීය ද?

(1) 2 (2) 3 (3) 5

**27.** මෙම රූපයේ ඇති මුළු ත්‍රිකෝණ ගණන කීය ද?

(1) 5යි

(2) 6යි

(3) 7යි



**28.** පහත කොටුව තුළ දී ඇති සියල්ල ම සම්පූර්ණයෙන් ම භාවිත කර සෑදිය හැකි රූපය තෝරන්න.





(1) (2) (3)

● පහත දී ඇති දැන්වීම් පුවරුව ඇසුරෙන් අංක **29** සහ **30** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

> <u>දේශීය වෛද්‍ය මධ්‍යස්ථානය</u>
>
> සෙනසුරාදා හැර සතියේ සෑම දිනක ම
> පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වාත්
> ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වාත් ප්‍රතිකාර කරනු ලැබේ.

**29.** වෛද්‍යවරයා සතියක් තුළ රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමට අපේක්ෂා කරන මුළු පැය ගණන,

(1) 24 කි. (2) 42 කි. (3) 49 කි.

**30.** දැන්වීම් පුවරුවේ සඳහන් තොරතුරු අනුව, පහත දී ඇති කුමන ප්‍රකාශය නිවැරදි ද?

(1) වෛද්‍ය මධ්‍යස්ථානයේ දී රෝගීන්ට නේවාසික ව ප්‍රතිකාර ලබා ගත හැකි වෙයි.
(2) වෛද්‍යවරයා බෝ වන රෝග සඳහා පමණක් ප්‍රතිකාර කරයි.
(3) වෛද්‍යවරයා ඖෂධ සඳහා ශාකමය ද්‍රව්‍ය බහුල ව භාවිත කරයි.

**31.** සිද්ධියකට අදාළ රූප 5 ක් පහත දී ඇත.



A B C D E

සිද්ධිය අනුව, දී ඇති රූප අනුපිළිවෙළට පෙළගැස්වූ විට ලැබෙන්නේ පහත කවරක් ද?

(1) B, C, D, A, E
(2) C, B, D, E, A
(3) C, B, D, A, E

**32.** බස් රථයක් තුළ දෙදෙනකු බැගින් වාඩිවිය හැකි මගී ආසන 15 ක් ද හයදෙනකුට වාඩිවිය හැකි එක් මගී ආසනයක් ද තිබේ. එම බස් රථයේ වාඩි වී යා හැකි උපරිම මගීන් ගණන කීය ද?

(1) 21 (2) 36 (3) 42

**33.** ළමයින් 4 දෙනකු හා වැඩිහිටියන් 3 දෙනකු සඳහා කිරි තේ සකස් කිරීමට කිරි ලීටරයක් අවශ්‍ය වේ. ඒ අනුව, ළමයින් 20 දෙනකු හා වැඩිහිටියන් 15 දෙනකු සඳහා කිරි තේ සකස් කිරීමට අවශ්‍ය කිරි ලීටර ගණන කීය ද?

(1) 5 (2) 7 (3) 15

[අටවැනි පිටුව බලන්න

34. 1 සිට 100 තෙක් සංඛ්‍යා ලිවීමේ දී 2 ඉලක්කම ලිවිය යුතු වාර ගණන කීය ද?

(1) 10 (2) 19 (3) 20

35. දිග, පළල හා උස 5 cm බැගින් වන ලී ඝනකයකින් දිග, පළල හා උස 1 cm බැගින් වන කුඩා ඝනක කීයක් කැපිය හැකි ද?

(1) 125 (2) 25 (3) 15

36. එක් දිනක් තුළ පැවැත්වුණු පරිසර දින වැඩසටහන් මාලාවක, ①, ②, ③ හා ④ යන වැඩසටහන් ආරම්භ වූ වේලාව පහත සඳහන් ඔරලෝසු මුහුණත්වල දැක්වේ.



① ② ③ ④

එක් වැඩසටහනක් අවසන් වූ විගසම ඊළඟ වැඩසටහන ආරම්භ විය. ④ වන වැඩසටහන අවසන් වූයේ දහවල් 12.00 ට ය. වැඩි ම කාලයක් පැවැත්වුණු වැඩසටහන කුමක් ද?

(1) ① (2) ② (3) ③

37. දිගහරින ලද ඝනකයක රූපයක් ඉදිරියෙන් දී ඇත. එහි මුහුණත්වල සංඛ්‍යා සටහන් කර තිබේ. මෙය ඝනකයක් ලෙස නැවත සකස් කළ විට, ප්‍රතිවිරුද්ධ මුහුණත්වල ඇති සංඛ්‍යා අතර සම්බන්ධතාවක් හඳුනා ගත හැකි වේ. එම සම්බන්ධතාව අනුව හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න.




(1) 22
(2) 21
(3) 20

38. පහත දැක්වෙන්නේ කම්බි රාමු තුනකි. P කෙළවරේ සිටින කුහුඹුවකුට, එක ම මාර්ගයේ දෙවතාවක් ගමන් **නොකර** සියලු ම මාර්ගවල ගමන් කළ හැක්කේ කුමන රාමුවේ ද?




(1) (2) (3)

39. එක ම ඉලක්කම එක් වතාවකට වඩා තිබෙන සේ කාඩ්පත් 20 ක එක් ඉලක්කම බැගින් ලියා ඇත. කාඩ්පත් 10 ක ඇති ඉලක්කම්වල එකතුව 12 කි. ඉතිරි කාඩ්පත් 10 හි ඇති ඉලක්කම්වල එකතුවට තිබිය හැකි වැඩි ම අගය,

(1) 20 කි. (2) 60 කි. (3) 90 කි.

40. ✤ ✤ ✤ = ○ ○ ○ ○ හා □ □ = ✤ ✤ ✤ ✤ වේ. පහත දී ඇති කුමන සම්බන්ධතාව නිවැරදි ද?

(1) ✤ ✤ ✤ ✤ ✤ = ○ ○ ○ ○ □ □
(2) □ □ ✤ □ = ○ ○ ○ ○ ✤ ✤
(3) ✤ ✤ ✤ ○ □ = ○ ○ ○ ○ ○ ✤ ✤

* * *

273508 ~~078508~~

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2016

**පාසල්වලට සිසුන් තෝරාගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2016 අගෝස්තු**

# II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

විභාග අංකය : ..................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ✳ ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- ✳ **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
- ✳ පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉරි මත** ලියන්න.
- ✳ පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**
- ✳ පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- ✳ කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කේත් අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

**1.** පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

පෙනෙන තෙක් මානයේ විහිදී ඇති වෙල්යාය ගොයම් පැළ නිසා නිල්ල ගැසී ඇත. නියර දිගේ තණකොළ අතර වැවී තිබෙන කුඩා පැළෑටිවල පුංචි පුංචි මල් පිපී ඇත. ඒ මල් රතුපාටින්, කහපාටින්, දම්පාටින් දිලෙන්නේ ගොයම් පැළවල සුන්දරත්වය තව තවත් වැඩි කරමින් ය. කුරුල්ලන්ගේ කිචි බිචි නාදය පරිසරයේ නිහඬ බව බිඳියි. වෙල්යායේ ඈත කොනකින් එන බටනළා වාදනයක හඬක් සුළඟට මුසුවෙයි.

ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරාගෙන, **තිත් ඉරි මත ලියන්න.**

(i) ඡේදයෙන් කියවෙන පරිසරය කුමක් ද?

: ..........................................................................................

(ii) කුඩා පැළෑටි වැවී තිබුණු ස්ථානය පිළිබඳ ව ඡේදයේ විස්තර කර ඇත්තේ කෙසේ ද?

: ..........................................................................................

(iii) බටනළා වාදනයක හඬ පැමිණියේ කොහේ සිට ද?

: ..........................................................................................

(iv) 'ළඟ' යන පදයට විරුද්ධාර්ථ පදයක් ඡේදයේ ඇත. එය සොයා ලියන්න.

: ..........................................................................................

(v) පාපිල්ල සහ ඇලපිල්ල යෙදුණු වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.

: ..........................................................................................

(vi) 'දර්ශනය වන සීමාවේ' යන අදහස, ඡේදයේ සඳහන් වන ආකාරය උපුටාගෙන ලියන්න.

: ..........................................................................................

**2.** අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) මුහුන / මුහුණ

(ii) විශේෂ / විශේශ

**3.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) ............ (ඔහු / ඔවුහු) දුරකථනය මේසය උඩ තැබුවේ ය.

(ii) ගායිකාවෝ ගීතයක් ............... (ගැයුවා ය / ගැයුවෝ ය).

(iii) ගුරුවරු අපට අවවාද .............. (දෙයි / දෙති).

(iv) මල් ............... (පිපෙයි / පිපෙති).

**4.** කොටුව තුළ දී ඇති වචනවලින් රකාරාංශය යෙදුණු වචනය **තිත් ඉර මත ලියන්න.**

| ඖෂධ, චාරිත්‍ර, මංගල්‍යය |
|---|

: ..........................................

**5.** ප්‍රස්තාව පිරුළක කොටසක් පහත දී ඇත. එම ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ වීමට හිස්තැනට තිබිය යුතු වචනය ලියන්න.

........................... ඉති කපන්නා වගේ.

විභාග අංකය :................................

078508

**6.** පහත දී ඇති අදහසට ගැළපෙන තනි වචනයක් **තිත් ඉර මත ලියන්න.**

වැස්ස ස්වල්පයක්වත් නොමැති කාලය : ........................................................................................

**7.** පහත සඳහන් වගන්තිවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) කණ්ණාඩිය තුළින් ඔහුට තම **පිළිබිඹුව** පෙනුණි. මෙහි තද කළු අකුරුවලින් ඇති වචනයට අර්ථයෙන් සමාන වන්නේ ..........................(රූපය / ප්‍රතිබිම්බය) යන්න ය.

(ii) ගත් වහර යනු .......................... (ලිවීමේ දී / කතා කිරීමේ දී) භාවිත කරන භාෂාවයි.

(iii) වප් මාසය ලෙස හැඳින්වෙන්නේ .......................... (ඔක්තෝබර් / දෙසැම්බර්) මාසයයි.

**8.** පහත සඳහන් කවියේ ඇති **හිස්තැන සම්පූර්ණ කරන්න.**

උපන්නෙත් මැරෙන්නෙත් තනියමයි ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින් නොවේ
අනුන් පිහිට තකමින් යුතුකම හමුවේ
..........................................................................................

**9.** එක්තරා ඇරියකගේ අදහස් ප්‍රකාශ වන ගීතයක පේළි හතරක් පහත දී ඇත. එය හොඳින් කියවන්න.

පිහිනා සිප් සයුර දෙතෙර
සියල් සතර දැන පිරිසිඳ
ලොවේ අනෙක අවමන් මැද නොසෙල්වෙමී
මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමී

(කුමාරදාස සපුතන්ත්‍රී විසින් රචනා කරන ලද ගීතයක කොටසකි)

ඉහත පේළි හතරෙහි එක් පේළියකින්, නොයෙකුත් අපහාස හමුවේ මෙම ඇරිය කම්පා නො වන බව ප්‍රකාශ වේ. එම පේළිය උපුටාගෙන ලියන්න.

: ..........................................................................................................................

**10.** පහත සඳහන් වාක්‍යය ලිඛිත භාෂාවට හරවා ලියන්න.

මම ගමට ගියා : ..........................................................................................................

**11.** (i) පහත දී ඇති ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල වචනය** ලියන්න.

waterfall : ..................................................................................................

(ii) රූපයේ දී ඇති සත්වයා සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන වචනය **ඉංග්‍රීසි අකුරුවලින්** ලියන්න.



:............................................................................

**12.** පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) Where ..................... (is / are) the playground?

(ii) I am ..................... (go / going) out.

**13.** පහත සඳහන් වාක්‍යය ඉංග්‍රීසි භාෂාවෙන් කියන ආකාරය **ඉංග්‍රීසි අකුරුවලින්** ලියන්න.

මෙය මගේ පාසලයි. : ..........................................................................................

**14.** පහත සඳහන් **දෙමළ වචනයේ අර්ථය සිංහලෙන්** ලියන්න.

පුරා : ..............................................................................................................

**15.** පහත සඳහන් වාක්‍යය **දෙමළෙන් කියන ආකාරය සිංහලෙන්** ලියන්න.

ආයෙත් එන්න. : ..............................................................................................................

**16.** පාසලේ වාර අවසාන නිවාඩුව ලැබෙන තෙක් මා බලා සිටියේ නොඉවසිල්ලෙනි. නිවාඩු කාලය විනෝදයෙන් ගත කරන ලෙසත් ඉගෙනීමේ වැඩ අමතක නොකරන ලෙසත් ගුරුතුමිය පැවසූ අයුරු මා සිත තුළ රැඳී තිබුණි. "පාසල් නිවාඩු කාලය මා ගත කළ අයුරු" යන මාතෘකාව පිළිබඳ ව වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක ම, වචන **පහකට වඩා වැඩියෙන් තිබිය යුතුයි. උක්ත / ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.**)

- ..............................................................................................................
  ..............................................................................................................
- ..............................................................................................................
  ..............................................................................................................
- ..............................................................................................................
  ..............................................................................................................

- **දී ඇති තිත් ඉරි මත පිළිතුරු සපයන්න.**

**17.** 


මෙම ගණක රාමුවෙන් නිරූපණය වන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

: ..............................................................

**18.** පහත දී ඇති සංඛ්‍යාවට පෙර ඇති සංඛ්‍යාවත් පසු ව ඇති සංඛ්‍යාවත් රෝම සංඛ්‍යාංකවලින් ලියන්න.

: ................. , ix, .............................

**19.** සිලින්ඩරයක ඇති වක්‍ර පෘෂ්ඨ ගණන කීය ද? : ..............................................................

**20.** (i) $\frac{1}{4}$ ට තුල්‍ය භාගයක් ලියන්න. : ..............................................................

(ii) ඉදිරියෙන් දී ඇති රූපයෙන් 0.3 ක් (පැන්සලෙන් හෝ පෑනෙන්) පාට කරන්න.



**21.**  මෙම රූපයට සමමිති රේඛා කීයක් ඇඳිය හැකි ද?

..............................................................

**22.** පැන්සල් 130 ක් 7 දෙනකු අතර සම සේ බෙදූ විට ඉතිරි වන පැන්සල් ගණන කීය ද?

: ..............................................................

**23.** පස්වරු 4 : 30 ට පොතක් කියවීමට ඇරඹූ ගයානිට එය කියවා අවසන් කිරීමට පැය 1 මිනිත්තු 35 ක් ගත විය. ඇය පොත කියවා අවසන් කළ වේලාව පැය විසි හතරේ ඔරලෝසුවේ දැක්වෙන ආකාරයට ඉලක්කමෙන් ලියන්න.

:..............................................................

**24.**

| | |
|---|---|
| 275 | 80 |
| 324 | 139 |

කොටුව තුළ ඇති සංඛ්‍යාවලින් සංඛ්‍යා දෙකක් එකතු කළ විට 404 ලැබේ. එම සංඛ්‍යා දෙක තෝරා ලියන්න.

:..............................................................

**25.** උද්‍යානයක කොටසක් පහත රූපසටහනේ දැක්වේ.




(i) ආපණ ශාලාව පිහිටා ඇත්තේ ප්‍රධාන දොරටුවේ සිට කුමන දිශාවෙන් ද?

:..............................................................

(ii) රූපසටහනේ දැක්වෙන **මාර්ගය ඔස්සේ** පුද්ගලයකු ප්‍රධාන දොරටුවේ **A** ස්ථානයේ සිට පොකුණේ **B** ස්ථානයට ගමන් කළේ නම්, ඔහු ගමන් කළ මුළු දුර කිලෝමීටර හා මීටරවලින් කොපමණ ද?

:..............................................................

**26.**



මෙම රූපය තුළ ඇති සෘජුකෝණයකට වඩා අඩු කෝණ ගණන කීය ද?

:..............................................................

**27.** පහත රූපයේ ඇති සෑම කුඩා කොටුවකම දිග 1 cm ද පළල 1 cm ද වේ. රූපයේ **අඳුරු කර ඇති හැඩ හතර** $A, B, C$ හා $D$ ලෙස නම් කර ඇත.




(i) $D$ අක්ෂරයෙන් පෙන්වන හැඩයේ පරිමිතිය කීය ද?

:..............................................................

(ii) වර්ගඵලයෙන් සමාන හැඩවලට හිමි අක්ෂර ලියා දක්වන්න.

:..............................................................

**28.** පොතක මිල රු. 40 ද පැන්සලක මිල රු. 12 ද ලෙස වෙළඳසැලක මිල දර්ශනයක සටහන් වී තිබුණි.

(i) වෙළඳසැලට ගිය අරුණිට පොත් තුනක් හා පැන්සලක් මිලට ගැනීමට අවශ්‍ය මුදල කීය ද?

:..............................................................

(ii) අරුණි පොත් තුනක් හා පැන්සලක් ගෙන වෙළඳසැල්හිමියාට රු. 50 නෝට්ටු 3 ක් දුන්නේ නම්, ඇයට ලැබුණු ඉතිරි මුදල කීය ද?

:..............................................................

**29.** සීනි 6 kg 500 g කින් සෑදිය හැකි 250 g සීනි පැකට්ටු ගණන කීය ද?

:..............................................

**30.** 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් වූ එක්තරා පාසලක ශිෂ්‍යයන්ගෙන් ලකුණු 150 ට වඩා වැඩියෙන් ලබාගෙන සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යා නිරූපණය කිරීමට මෙම ප්‍රස්තාරය ඇඳ ඇත.




(i) 5B පන්තියේ සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 5C පන්තියේ සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මෙන් තුන්ගුණයකි. 5C පන්තියේ සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

(ii) එම පාසලේ සුදුසුකම් ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණ ද?

:..............................................

(iii) සුදුසුකම් ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් $\frac{3}{4}$ කට ජනප්‍රිය පාසල්වලට ඇතුළත් වීමට වරප්‍රසාද හිමි වූයේ නම්, එම ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණ ද?

:..............................................

- ප්‍රශ්න අංක **31** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරාගෙන **ඊට යටින් ඉරක් අඳින්න**.

**31.** රෝස පැහැති දළු හටගන්නා ශාකයකි.
(1) දෙහි (2) නා (3) බුලත් (4) කොස්

**32.** එක් බීජයක් පමණක් තිබෙන පලතුරකි.
(1) නෙල්ලි (2) දිවුල් (3) මැංගුස් (4) දෙළුම්

**33.** කාල නියමයක් **නොමැතිව** වසර පුරා ම මල් පිපෙන්නේ පහත සඳහන් කුමන ශාක වර්ගයේ ද?
(1) රබර් (2) පොල් (3) එරබදු (4) රඹුටන්

**34.** ශාක පත්‍ර ආහාරයට ගන්නා සතෙකි.
(1) බකමූණා (2) උකුස්සා (3) සමනළයා (4) ගොලුබෙල්ලා

**35.** බොහෝ විට ඇඳුම්වල හෝ සතුන්ගේ ශරීරවල හෝ ඇලවී ව්‍යාප්ත වන බීජයකි.
(1) හොර (2) තුත්තිරි (3) කුඩලු (4) වරා

**36.** කැටයම් කරන ලද සත්ව පේළි ද සහිත විශිෂ්ට කලාත්මක නිර්මාණයකි.
(1) සෙල් ලිපිය (2) පුන්කලස (3) සඳකඩ පහණ (4) පුරාවිද්‍යා ලාංඡනය

**37.** ශ්‍රී ලංකාවේ පිහිටි පූජනීය **නො වන** ඓතිහාසික ස්ථානයකි.
(1) රුවන්වැලිසෑය (2) ගාලු කොටුව (3) ශ්‍රී පාදය (4) ථූපාරාමය

**38.** ශ්‍රී ලංකාවට නැගෙනහිරින් පිහිටා ඇති රටකි.
(1) මැලේසියාව (2) ඉන්දියාව (3) එංගලන්තය (4) ග්‍රීසිය

[හත්වැනි පිටුව බලන්න.

**39.** දැති රෝද සහිත උපකරණයකි.

(1) බයිසිකලය (2) වීල්බැරෝව (3) හිරමණය (4) විදුලි පංකාව

**40.** අත් ආවරණ හා පා ආවරණ පළඳින්නේ පහත සඳහන් කුමන ක්‍රීඩාවේ දී ද?

(1) එල්ලේ (2) අත්පන්දු (3) ක්‍රිකට් (4) බැඩ්මින්ටන්

**41.** 'දිය හොල්මන' ප්‍රයෝජනවත් වන්නේ කා හට ද?

(1) ගොවියාට (2) කිමිදුම්කරුවාට (3) ධීවරයාට (4) පිහිනුම් ක්‍රීඩකයාට

**42.** පෞද්ගලික ව ම පරිහරණය කළ යුතු භාණ්ඩ වර්ග දෙකකි.

(1) දුරකථනය, පෑන (2) පනාව, දත් බුරුසුව
(3) පනාව, කුඩය (4) කුඩය, දත් බුරුසුව

**43.** පහත දී ඇති රූපවලින් 'මහවලහා' තරු රටාව පෙන්වන රූපය කුමක් ද?


(1)


(2)


(3)


(4)

**44.** හිරුඑළිය ඇති ස්ථානයක රූපයේ දැක්වෙන උපකරණ තබා ජල භාජනයේ ඇති ජලය උණුසුම් කර ගත හැකි ය. මෙහි දී A භාජනය ලෙස භාවිත කළ හැක්කේ පහත සඳහන් කවරක් ද?




(1) හොඳින් දිලිසෙන ඇලුමිනියම් තාච්චියක් (2) අලුත් මැටි වළඳක්
(3) විශාල ගනකමක් ඇති වීදුරු කෝප්පයක් (4) ප්ලාස්ටික් බේසමක්

**45.** ශරීරය වර්ධනය කිරීම සඳහා වැඩි ම දායකත්වයක් සැපයෙන ආහාර ද්‍රව්‍ය කාණ්ඩයකි.

(1) බත්, සීනි, මුං ඇට (2) පරිප්පු, තිවිති, ගොටු කොළ
(3) පරිප්පු, මුං ඇට, සෝයා බෝංචි (4) අඹ, අන්නාසි, දොඩම්

**46.** මස් කල් තබා ගැනීමට භාවිත කළ පැරණි ක්‍රමයකි.

(1) ලුණු ද්‍රාවණයක ගිල්වා තැබීම (2) තැම්බීම
(3) මී පැණිවල ගිල්වා තැබීම (4) රසකාරක එකතු කිරීම

**47.** අතීත රජවරුන් විසින් කරන ලද වාරි කර්මාන්ත මගින් අපේ රටේ ප්‍රධාන වශයෙන් කෙරෙන නිෂ්පාදනයකි.

(1) තේ (2) ලුණු (3) එළවලු (4) සහල්

**48.** ජලභීතිකාව රෝගය වැළඳීමට හේතු වන රෝග බීජ මිනිස් සිරුරට ඇතුළු විය හැක්කේ පහත සඳහන් කුමන සත්වයාගෙන් ද?

(1) මදුරුවා (2) කැරපොත්තා (3) බළලා (4) ගෙමැස්සා

**49.** ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන වසංගත රෝග වැඩි සංඛ්‍යාවක් සඳහා හේතු වන සත්ව වර්ගය

(1) මීයන් ය. (2) බල්ලන් ය. (3) මදුරුවන් ය. (4) මැස්සන් ය.

**50.** ප්‍රසිද්ධ ලේඛකයකු ලෙස හා තාරකා විද්‍යාඥයකු ලෙස ලෝකයට විශිෂ්ට සේවාවක් සිදු කළ අයෙකි.

(1) ශ්‍රීමත් ආතර් සී. ක්ලාක් (2) ශ්‍රීමත් ඩී. බී. ජයතිලක
(3) ආචාර්ය ටී. බී. ජයා (4) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි

**51.** ශ්‍රී ලංකාවට ප්‍රථම වරට ඔලිම්පික් පදක්කමක් හිමි කර දුන්නේ කවුද?

(1) සුසන්තිකා ජයසිංහ (2) ඩන්කන් වයිට් (3) ජූලියන් බෝලිං (4) දීපිකා චන්මුගම්

**52.** සමාජ විරෝධි ක්‍රියාවක් **නො වන්නේ** පහත සඳහන් කවරක් ද?

(1) මත්ද්‍රව්‍ය වෙළඳාම  (2) ළමයින් සේවයට යොදවා ගැනීම
(3) දුම්රිය පොළෙහි දී දුම්පානය කිරීම  (4) බස් රථ තුළ ආහාර ද්‍රව්‍ය විකිණීම

**53.** වැවක් පිහිටන ස්ථානයක් සලකුණු කිරීමට ශ්‍රී ලංකා සිතියම්වල යොදා ගන්නේ

(1) නිල්පාට දිග රේඛාවකි.
(2) නිල්පාට රේඛාවක් මත යෙදූ තිතකි.
(3) නිල්පාටින් පාට කළ කුඩා ප්‍රදේශයකි.
(4) එක් ස්ථානයකට සම්බන්ධ කළ නිල්පාට රේඛා කිහිපයකි.

**54.** පාසල් වත්තේ මිරිස් පාත්තියක් සකස් කිරීමට තෝරා ගත යුත්තේ

(1) හිරුඑළිය අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරලු සහිත බිමකි.
(2) බොරලු සහිත ජලය බැසයන තැනිතලා බිමකි.
(3) හිරුඑළිය හොඳින් ලැබෙන ජලය බැසයන බොරලු රහිත තැනිතලා බිමකි.
(4) හිරුඑළිය ඉතා අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරලු රහිත තැනිතලා බිමකි.

**55.** යම් පුද්ගලයකුට දේදුන්නක් දර්ශනය විය හැක්කේ පහත සඳහන් කුමන අවස්ථාවේ දී ද?

(1) අකුණු සමග අධික වර්ෂාව ඇති විට
(2) අධික වර්ෂාව සමග සුළඟ ඇති විට
(3) හිරුඑළිය සමග යාන්තමින් වර්ෂාව ඇති විට
(4) හිරුඑළිය සමග වියළි සුළඟ ඇති විට

**56.** විදුහල්පතිවරයකුට පාසල් වේලාව තුළ දී හදිසි රැස්වීමක් සඳහා ගුරුවරුන් හා සියලු ම සිසුන් ප්‍රධාන ශාලාවට රැස්කර ගැනීමට අවශ්‍ය ව ඇත. පාසලේ සියලු පහසුකම් තිබේ නම්, රැස්වීමට පැමිණෙන ලෙස සියලු දෙනාට ම එකවර දැනුම් දීමට විදුහල්පතිවරයාට යොදා ගත හැකි සන්නිවේදන මාධ්‍යය කුමක් ද?

(1) දුරකථනය  (2) පරිගණකය  (3) දැන්වීම් පත්‍රිකාව  (4) ශබ්ද වාහිනිය

**57.** මාර්ග නීති රීතිවලට අනුව, ශ්‍රී ලංකාවේ මහා මාර්ගවල ධාවන මාර්ග මත රේඛා ඇඳීමට භාවිත කරන වර්ණ මොනවා ද?

(1) කහ, කළු  (2) කළු, සුදු  (3) කහ, සුදු  (4) කහ, රතු

**58.** ශ්‍රී ලංකාව තුළ පොදු වාහන මගින් සිදු කෙරෙන ගමනාගමන සේවය, මහජනතාවට වඩාත් හිතකර සේවයක් වීම සඳහා පහත කුමන යෝජනාව ක්‍රියාත්මක කිරීම වඩාත් සුදුසු වේ ද?

(1) නියමිත කාල සටහනකට අනුව සියලු ම පොදු වාහන ධාවනය කිරීම
(2) පොදු වාහන තුළ රූපවාහිනි හා ගුවන්විදුලි යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම
(3) දහවල් කාලය තුළ පොදු වාහන ධාවනය සීමා කිරීම
(4) ධාවනය වීමේ දී නැවතුම් ස්ථාන කිහිපයක පමණක් පොදු වාහන නතර කිරීම

**59.** ගිනි ගැනීමකින් ශරීරයේ යම් ස්ථානයක් පිළිස්සුණු පුද්ගලයකුට ප්‍රථමාධාර ලබා දීමේ දී අප විසින් පළමුවෙන් ම කළ යුතු දෙය කුමක් ද?

(1) පිළිස්සුණු ස්ථානයට ඇලී ඇති ඇඳුම් ඉවත් කිරීම
(2) පිළිස්සුණු ස්ථානය මත තෙල් වර්ගයක් ආලේප කිරීම
(3) දිය බිබිලි මත ආලේපන වර්ගයක් ගැල්වීම
(4) පිරිසිදු ඇල් දියෙන් පිළිස්සුණු ස්ථානය සිසිල් කිරීම

**60.** "සෞභාග්‍යවත් ස්වයංපෝෂිත රටක ඉර හඳ පවත්නා තාක්කල් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා!" මෙම අදහස පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකාවේ

(1) ජාතික කොඩියෙනි. (2) රාජ්‍ය ලාංඡනයෙනි. (3) ජාතික වෘක්ෂයෙනි. (4) ජාතික ගීයෙනි.

***

# 2016 පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01 – 1 | 09 – 3 | 17 – 3 | 25 – 3 | 33 – 1 |
| 02 – 3 | 10 – 1 | 18 – 1 | 26 – 2 | 34 – 3 |
| 03 – 2 | 11 – 3 | 19 – 2 | 27 – 2 | 35 – 1 |
| 04 – 1 | 12 – 1 | 20 – 1 | 28 – 2 | 36 – 2 |
| 05 – 2 | 13 – 3 | 21 – 1 | 29 – 2 | 37 – 2 |
| 06 – 3 | 14 – 3 | 22 – 2 | 30 – 3 | 38 – 2 |
| 07 – 2 | 15 – 2 | 23 – 2 | 31 – 2 | 39 – 3 |
| 08 – 3 | 16 – 1 | 24 – 1 | 32 – 2 | 40 – 3 |

## II පත්‍රය

01. i) වෙල් ගොයක් යායා.
ii) නියර දිගේ තණකොළ අතර
iii) වෙල්යායේ ඈත කොනකින්
iv) ඈත.
v) කුඹා / ගත්තාමින්
vi) ගොතා ගීතත්මානයේ

02 i) 2 ii) 1
03 i) 1 ii) 2 iii) 2 iv) 1
04. චාරිත්‍ර
05 ගගට
06 නියඟය, ඉඟෝරය.
07 i) 2 ii) 1 iii) 1
08 බියෙන් මල වදිනා අප හට කරමි නොවේ.
09. ලොවේ අනෙක අවමාන් ඇද නොපෙල්වෙමි.
10. මම ගමට ගියෙමි.
11. i) දිය ඇල්ල ii) Rabbit
12. i) is ii going
13 This is my school.
14. පරිවිය
15. මින්තුමි වාර්ටංගල්
16. –
17. 210 ්
18. viii , X
19. 1 යි.
20 $\frac{2}{8}$, $\frac{3}{12}$...

21. 2 යි
22. 4 යි
23. 18:05 / 1805 / 1805h / පැය 1805
24. 80, 324
25. i) කිලෝමීටර, 1km 81m.
26. 7 යි
27. i) 12cm ii) B, C
28. i) රු. 132.00
ii) රු. 18.00
29. 26 යි
30. i) 6 දස්තා කොටු 3ක් පාට කරන්න.
ii) 44
iii) 33

| | | |
|---|---|---|
| 31 – 2 | 42 – 2 | 53 – 3 |
| 32 – 1 | 43 – 2 | 54 – 3 |
| 33 – 2 | 44 – 1 | 55 – 3 |
| 34 – 4 | 45 – 3 | 56 – 4 |
| 35 – 2 | 46 – 3 | 57 – 3 |
| 36 – 3 | 47 – 4 | 58 – 1 |
| 37 – 2 | 48 – 3 | 59 – 4 |
| 38 – 1 | 49 – 3 | 60 – 2 |
| 39 – 1 | 50 – 1 | |
| 40 – 3 | 51 – 2 | |
| 41 – 1 | 52 – 4 | |

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

**EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2015**

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2015 අගෝස්තු

## I පත්‍රය

**මිනිත්තු 45 යි.**

විභාග අංකය : .......................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |



(2 වැනි පිටුව බලන්න

- අංක **1** සහ **2** ප්‍රශ්නවල මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට, ගැළපෙන කොටස තෝරන්න.

**1.** 

 (1)

 (2)

 (3)

**2.** 

 (1)

 (2)

 (3)

- රඹුටන් ගසක් රූපයේ දැක්වේ. ඒ ඇසුරෙන් අංක **3** සහ **4** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**3.** රාත්‍රි කාලයේ රඹුටන් කෑමට මෙම ගසට පැමිණෙන සතෙකි.

(1) බකමූණා (2) ඇටිකුකුළා (3) වවුලා

**4.** කඳෙහි A ස්ථානයේ බෙනයක් සෑදිය හැකි සහ පත්‍රවලින් B ස්ථානයේ ගොටුවක් සෑදිය හැකි සතුන් දෙදෙනකු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කොට්ටෝරුවා, දිමියා
(2) ගිරවා, දළඹුවා
(3) කොට්ටෝරුවා, දළඹුවා

**5.** එක ම මකුළු දැලක රූප 3 ක් පහත දී ඇත. ඊතලවලින් දැක්වෙන මාර්ග ඔස්සේ ගමන් කළ විට, කුඩා මකුළු පැටවකුට P සිට Q දක්වා යා හැකි **දුර වැඩි ම** මාර්ගය දැක්වෙන රූපය තෝරන්න.



(1)



(2)



(3)

විභාග අංකය ....................................

6. දී ඇති රූපයේ ? ලකුණ තිබෙන තීරුවේ තිබිය යුතු සංකේත කාණ්ඩය කුමක් ද?

| | | |
|---|---|---|
| ▲ | □ | ? |
| □ | △ | |
| △ | ▲ | |

(1) △ ▲ □   (2) △ □ ▲   (3) □ ▲ △

7. පහත දී ඇති වාක්‍ය අතුරෙන් නිවැරදි ව ලියා ඇති වාක්‍යය තෝරන්න.
   (1) මළුවා ඇම ගිලීවී.
   (2) මාළුවා ඇම ගිලිවී.
   (3) මාළුව ඇම ගිලිවී.

8. 'අත්තනෝමතික' යන වචනයෙහි ඇති අකුරු මගින් සෑදිය හැකි වචනයකි.
   (1) අනෝමා   (2) අත්තන   (3) කමත

9. දී ඇති ද්‍රව්‍ය යුගලවලින්, පළමුවැන්න භාවිත කිරීමට දෙවැන්න අත්‍යවශ්‍ය වන ද්‍රව්‍ය යුගලය අඩංගු පිළිතුර තෝරන්න.
   (1) පොත - පෑන   (2) ඉදිකටුව - නූල   (3) කෝප්පය - පීරිසිය

10. 123, 234, 345, ......, 567
    රටාව අනුව හිස්තැනට තිබිය යුතු සංඛ්‍යාව කුමක් ද?
    (1) 456   (2) 468   (3) 678

11. පහත රූප සටහනේ රටාව අනුව, A හා B සඳහා තිබිය යුතු සංඛ්‍යා පිළිවෙළින් මොනවා ද?




(1) 4, 3
(2) 3, 2
(3) 3, 4

- පහත දී ඇති කොටුවේ සඳහන් සංකේත ඇසුරෙන් අංක **12** සහ **13** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| △ | = | උදව් | ● | = | හරිම |
| ✱ | = | ගොඩාක් | □ | = | කළාට |
| ▲ | = | මිහිරියි | ♦ | = | ස්තූතියි |
| ■ | = | ලස්සනයි | ♫ | = | ගීතය |
| ○ | = | ඔබේ | ✤ | = | කරුණාව |

12. ආචාරශීලි හැසිරීමකට අදාළ ප්‍රකාශයක් දැක්වෙන සංකේත පේළිය තෝරන්න.
    (1) ○△■▲   (2) △□✱♦   (3) ○△●▲

13. අගය කිරීමේ ප්‍රකාශයක් දැක්වෙන සංකේත පේළිය තෝරන්න.
    (1) ○♫✱♦   (2) ○✤✱■   (3) ○♫●▲

14. c, b, o යන ඉංග්‍රීසි අකුරු තුන මුහුණ බලන කණ්ණාඩියක් ඉදිරියෙන් ඇල්ලූ විට, ඉන් එක් අකුරක් වෙනත් ඉංග්‍රීසි අකුරක් ලෙස කණ්ණාඩිය තුළින් පෙනේ. එම අකුර කුමක් ද?
    (1) c   (2) b   (3) o

(4 වැනි පිටුව බලන්න

**15.** සමමිති රේඛා දෙකක් පමණක් ඇති රූපය තෝරන්න.



(1) (2) (3)

**16.** පහත දී ඇති රූප තුනෙන් එක් රූපයක් අනෙක් රූප දෙකට වඩා වෙනස් ය. එම වෙනස් රූපය තෝරන්න.



(1) (2) (3)

**17.** X කඩදාසිය පිළිවෙළින් ①, ② සහ ③ යන තිත් ඉරි දිගේ තුන් වතාවක් නවනු ලැබේ. ඉන්පසු, තුන්වැනියට නවන ලද දාරය මැදින් Y රූපයේ දැක්වෙන ආකාරයට ත්‍රිකෝණාකාර කොටසක් කපා ඉවත් කර, කඩදාසිය දිගහැර බැලූ විට දක්නට ලැබෙන රූපය කුමක් ද?






(1) (2) (3)

**18.**  ට ... නම්,  ට .................. වේ.




**19.** පෙබරවාරි මාසයේ 5 වැනි දා බදාදා දිනයකි. එම මාසයට ඇති ඉරිදා දින ගණන කීය ද?

(1) 3 (2) 4 (3) 5

**20.** කකුල් තුනේ මේසයක් වටේ කකුල් හතරේ පුටු හතරක් ඇත. කකුල්වල මුළු එකතුව කීය ද?

(1) 16 (2) 19 (3) 20

**21.** ජල භාජනයක පතුලේ කාසියක් ඇත. ජල පෘෂ්ඨයට ඉහළින් බැලූ විට කාසිය පෙනෙන A ස්ථානය නිවැරදි ව දැක්වෙන රූපය තෝරන්න.




(1) (2) (3)



(5 වැනි පිටුව බලන්න

**22.** පා පැදියක් මිල දී ගැනීමට රු. 8500ක් අවශ්‍ය විය. මා ළඟ තිබුණේ රු. 4800කි. ඉතිරිය මිතුරන් දෙදෙනකුගෙන් ලබා ගතිමි. ලබා ගත් මුදල් විය හැක්කේ,

(1) රු. 2400 හා රු. 1300 ය.
(2) රු. 2500 හා රු. 2300 ය.
(3) රු. 5200 හා රු. 3300 ය.

**23.** රූපයේ ඇති සෑම කුඩා කොටුවක ම දිග හා පළල සමාන වේ.
රූපයේ ඇති මුළු සමචතුරස්‍ර ගණන කීය ද?



(1) 12
(2) 15
(3) 17

**24.** බසයක ගමන් කළ ශිෂ්‍යයකු තම ගමන් වියදම ගන්නා ලෙසට රු. 20ක් කොන්දොස්තර මහතාට දුන් විට, කොන්දොස්තර මහතා ශිෂ්‍යයාගෙන් තවත් රු. 2ක් ඉල්ලා ගෙන රු. 10ක් ඉතිරිය ලෙස දුන්නේ ය. බස් ගාස්තුව කීය ද?

(1) රු. 10 (2) රු. 12 (3) රු. 14

**25.** සන්ධ්‍යා කාලයේ දී උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල තැනින් තැන ගිගුරුම් සහිත වැසි ඇති විය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිවේදනය කර සිටී.
මෙම නිවේදනය අනුව, වැසි ඇති විය හැකි නගර දෙකක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) වවුනියාව, මඩකලපුව
(2) පොළොන්නරුව, කතරගම
(3) අනුරාධපුරය, අම්පාර

**26.** ඔරලෝසුවක පැය කටුවත් මිනිත්තු කටුවත් අතර කෝණය සෘජු කෝණයකට වඩා අඩු අවස්ථාවක් පෙන්වන්නේ පහත සඳහන් කුමන වේලාවේ දී ද?

(1) පෙ.ව. 9.30 (2) ප.ව. 12.15 (3) ප.ව. 3.40

**27.** ශ්‍රී ලංකාවේ ඇති දියඇලි අතුරෙන් දියලුම ඇල්ල, දුන්හිඳ ඇල්ලට වඩා උස ය.
ලක්ෂපාන ඇල්ල, දියලුම ඇල්ලට වඩා උස ය.
මෙම දියඇලි තුනෙන් උස අඩු ම හා වැඩි ම දියඇලි දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) දියලුම, දුන්හිඳ
(2) දුන්හිඳ, දියලුම
(3) දුන්හිඳ, ලක්ෂපාන

**28.** 100 සිට 110 තෙක් සංඛ්‍යා ලිවීමේ දී '0' ලියවෙන වාර ගණන,

(1) 9 කි. (2) 10 කි. (3) 12 කි.

**29.** ළමයකු වයස අවුරුදු 10 හා 16 වන විට ප්‍රසිද්ධ විභාග දෙකකට ඉදිරිපත් විය යුතු ය. ගීතානි, නිලානිට වඩා අවුරුදු පහකින් වැඩිමහල් ය. ගීතානි පළමුවැනි විභාගයට ඉදිරිපත් වන්නේ 2017 වර්ෂයේ දී නම්, නිලානි දෙවැනි විභාගයට ඉදිරිපත් විය යුතු වර්ෂය කුමක් ද?

(1) 2022 (2) 2028 (3) 2032



(6 වැනි පිටුව බලන්න

**30.** A හා B ත්‍රිකෝණ දෙක කඩදාසියකින් කපා ගෙන ඇත. A ත්‍රිකෝණය මත B ත්‍රිකෝණය තැබූ විට ලැබිය හැකි හැඩයක් දැක්වෙන රූපය කුමක් ද?






(1) (2) (3)

**31.** මම පිරිමියෙක් වෙමි. ගුණදාසගේ පුතා මගේ බාප්පා නම්, ගුණදාස හා මා අතර ඇති ඥාති සම්බන්ධය කුමක් ද?

(1) ගුණදාස මගේ සීයා ය.
(2) ගුණදාස මගේ මාමා ය.
(3) ගුණදාස මගේ පියා ය.

**32.** 4 හා 5 යන සංඛ්‍යා දෙකෙන් ම ඉතිරි නැතිව බෙදෙන, 25 ත් 75 ත් අතර ඇති සංඛ්‍යා ගණන කීය ද?

(1) 2 (2) 4 (3) 5

**33.** නිවසක රූපවාහිනිය ප.ව. 1.00 සිට ප.ව. 3.15 දක්වා ද පරිගණකය ප.ව. 2.15 සිට ප.ව. 3.30 දක්වා ද විදුලිපංකාව ප.ව. 2.30 සිට ප.ව. 3.45 දක්වා ද ක්‍රියාත්මක වුණි.
විදුලි උපකරණ තුන ම එක විට ක්‍රියාත්මක වූ කාලය

(1) මිනිත්තු 45 යි.
(2) පැය 1 යි.
(3) පැය 1 යි මිනිත්තු 15 යි.

**34.** පහත දී ඇති රූප තුනෙහි කුඩා කොටු සියල්ල ම සමාන ය. එම රූපවල ඇති තිත් ඉරි දිගේ නැවීමෙන් ඝනකයක් සාදා ගත හැකි වන්නේ කුමන රූපය මගින් ද?



(1) (2) (3)

**35.** □ × □ = △ ද
△ + △ = ○ ද
○ × ○ = 64 ද නම්, □ + △ + ○ හි අගය කුමක් ද?

(1) 4 (2) 8 (3) 14

**36.**



ඉහත රූපය අනුව, පහත සඳහන් කුමන ප්‍රකාශය නිවැරදි ද?

(1) වෘත්ත ගණන, ත්‍රිකෝණ ගණනට සමාන වේ.
(2) සෘජුකෝණාස්‍ර ගණන, වෘත්ත ගණන මෙන් දෙගුණයක් වේ.
(3) සෘජුකෝණාස්‍ර ගණන හතක් වේ.

**37.** වෛද්‍යවරයෙක් රෝගියකුට බෙහෙත් වර්ගයක් බීම සඳහා පහත සඳහන් උපදේශය දී ඇත.

"එක් වරකට පෙති 2 බැගින් දිනකට 3 වරක් (කෑමට පසු) ගන්න."

රෝගියාට බෙහෙත් පෙති 50 ක් දී තිබේ. පළමු බෙහෙත් වේල උදේ කෑමට පසු ගත්තේ නම්, එම පෙති ගණන **සම්පූර්ණ දින** කීයකට ප්‍රමාණවත් වේ ද?

(1) 8 (2) 9 (3) 25

**38.**

| | |
|---|---|
| 52 | 84 |
| .... | .... |

කොටුව තුළ හිස්තැන් දෙකට එන සංඛ්‍යා දෙකෙන් එකක්, අනෙක මෙන් තුන් ගුණයක් වන අතර, එම සංඛ්‍යා හතරේ එකතුව 200 වේ. හිස්තැන්වල තිබිය යුතු සංඛ්‍යා මොනවා ද?

(1) 16, 48 (2) 18, 54 (3) 19, 57

**39.** පහත සඳහන් රූපවල ඇති සංඛ්‍යා රටාව හඳුනාගෙන හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න.




(1) 12
(2) 60
(3) 72

**40.** රතු, නිල්, තැඹිලි, කහ, සුදු යන පාටවලින් යුක්ත තීරු පහකින් සමන්විත කොඩියක් රූපයේ දී ඇත.




- කොඩියේ 4 වන තීරුව සුදු පාට ය.
- රතු පාට තීරුවේ සිට ඇති තුන්වැනි තීරුව නිල් පාට ය.
- තැඹිලි පාට තීරුව හා කහ පාට තීරුව එක ළඟ පිහිටා නැත.

මේ අනුව, 1 හා 5 තීරුවලට තිබිය හැකි පාට අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කහ, නිල් (2) තැඹිලි, නිල් (3) රතු, තැඹිලි

* * *

266310

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2015

**පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2015 අගෝස්තු**

# II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

රහසයි

විභාග අංකය : ..............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
* පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉරි මත** ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**
* පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |

[2 වැනි පිටුව බලන්න.

**1.** පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

දවල් ඉර අව්ව වනය මත වැටී ගියාට පසු, ගස් මුදුන්වල සුළඟ හැපීමෙන් ඇති වන හඬ හා වියළි අතු එකිනෙක ගැටීමෙන් නඟින හඬත් හැර අන් කිසිම ශබ්දයක් වන ගැබ තුළින් අසන්නට නොලැබේ. එහෙත් වන සත්තු, ගස් යට පඳුරු අතර රිංගමින් එබිකම් පාමින් ඉතා සන්සුන් ව සේයාවන් මෙන් ඔබ මොබ හැසිරෙති.

ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ගෙන, **තිත් ඉරි මත ලියන්න.**

(i) ඡේදයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳ ව ද?

: ..................................................................................

(ii) වියළි අතු මගින් හඬ ඇති වන්නේ කෙසේ ද?

: ..................................................................................

(iii) ප්‍රාණවාචී බහුවචන නාම පදයක් ඡේදයෙන් ම සොයා ලියන්න.

: ..................................................................................

(iv) "ඉස්පිල්ල හා ඇලපිල්ල" යන දෙක ම පිළිවෙළින් යෙදී ඇති වචනය ඡේදයෙන් උපුටා ගෙන ලියන්න.

: ..................................................................................

(v) "එහා මෙහා" යන්නෙහි අදහසට සමාන අදහස දෙන පදය ඡේදයෙන් උපුටා ගෙන ලියන්න.

: ..................................................................................

(vi) ඡේදයෙහි සඳහන් උපමාව ලියන්න. : ..................................................

..................................................................................

**2.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට අදාළ නිවැරදි වචනය වරහන් තුළින් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) ශබ්ද ..................... (විකාශන / විකාෂණ) යන්ත්‍රය නැවත ක්‍රියාත්මක විය.

(ii) හුරුපුරුදු තේමා වාදනයක් ..................... (ඇසිනි / ඇසිණි).

**3.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පදය වරහන් තුළින් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) අපි නියර දිගේ ............ (යමි / යමු).

(ii) ඔවුහු ඇඩි උනන්දුවකින් වැඩ ............... (කළේ ය / කළෝ ය).

(iii) ගුරුතුමිය කඩිසර ගමනින් පන්තියට ............... ( පැමිණියා ය / පැමිණියේ ය).

**4.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) 'මතුර වල' යන පද පෙරළිය ලිහූ විට ලැබෙන්නේ ............ (වතුර මල / වතුර වල) යන්න ය.

(ii) ''අක්කා **නැවුම්** කළයට ගෙනා වතුර සිසිල් ය.'' මෙම වාක්‍යයේ තද කළු අකුරෙන් ඇති වචනයේ අදහස ............... (පිරිසිදු / අලුත්) යන්න ය.

**5.** පහත සඳහන් පද්‍යයේ ඇති **හිස්තැන සම්පූර්ණ කරන්න.**

බීමට එක කිරි උගුරක්
කෑමට තිසි රස අහරක්
..................................................
අනේ පුතේ විඳින දුකක්

[3 වැනි පිටුව බලන්න.

විභාග අංකය :.................................

266310

**6.** පහත සඳහන් පද්‍යය කියවා, අසා ඇති ප්‍රශ්නයට පිළිතුර **තිත් ඉර මත ලියන්න.**

මා පියා සහ ගුරු
නෑදෑ සොහොවුරු
හැමට ම කීකරු
සැපතෙකි මේ දරු

මෙහි සඳහන් දරුවාගේ හොඳ ගතිගුණය කුමක් ද?

.................................................................................................................................

**7.** 'නැත' යන අර්ථය හැඟවෙන ලෙස, පහත දී ඇති යෙදුම තනි වචනයෙන් ලියන්න.

'තෙමෙයි' : .........................................................................

**8.** පහත දී ඇති අදහස ප්‍රකාශ කෙරෙන **තනි වචනය,** ඉදිරියේ ඇති **තිත් ඉර මත ලියන්න.**

ගඟක් මුහුදට වැටෙන ස්ථානය : ...............................................................

**9.** පහත සඳහන් වචන ගළපා අර්ථවත් **වාක්‍යයක්** ලියන්න.

සමීප / පරිසරය / හා / තිබෙන්නේ / මිනිසා / සම්බන්ධයකි / අතර / ඉතා

.................................................................................................................................

.................................................................................................................................

**10.** දී ඇති ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට
1. "මිල කළ නොහැකි" යන අර්ථය දෙයි.
3. ප්‍රධාන දිශාවලින් එකකි.

පහළට
2. පොළොවෙන් ලබා ගන්නා ද්‍රව්‍යයකි.




**11.** පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) Where ..................... (is / are) you going?

(ii) I ..................... (want / wants) to pluck flowers.

**12.** පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යවල අර්ථය **සිංහලෙන්** ලියන්න.

(i) Please think about others.

.................................................................................................................................

(ii) I love my country. : ...............................................................................

**13.** පහත සඳහන් වාක්‍යයේ අර්ථය **ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසි අකුරුවලින් ම** ලියන්න.

ඔබ සූදානම් ද? : ...............................................................................

**14.** පහත සඳහන් **දෙමළ වචනයේ අර්ථය සිංහලෙන්** ලියන්න.

நுளம்பு : ...............................................................................

[4 වැනි පිටුව බලන්න.

**15.** පහත සඳහන් වාක්‍යය **දෙමළෙන් කියන ආකාරය සිංහලෙන්** ලියන්න.

ඉර පායනවා. : ..........................................................................................

**16.** ඉමක් කොනක් නොපෙනෙන අහස, පොළොව, මහසයුර සොබාදහමේ අපූරු නිර්මාණ වේ. මොහොතින් මොහොත වෙනස් වන අහස, අපේ ජීවිතවලට සුන්දර අත්දැකීම් එකතු කරයි. අසිරිමත් අහස යන මාතෘකාව පිළිබඳ ව වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක ම, වචන **පහකට වඩා වැඩියෙන් තිබිය යුතුයි. උක්ත / ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.**)

- ..........................................................................................
  ..........................................................................................
- ..........................................................................................
  ..........................................................................................
- ..........................................................................................
  ..........................................................................................

- **දී ඇති තිත් ඉරි මත පිළිතුරු සපයන්න.**

**17.** අකුරෙන් දී ඇති සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

හැටනවදහස් අනූනවය : ..........................................

**18.**

| | |
|---|---|
| 8 | 4 |
| 3 | 6 |

කොටුව තුළ ඇති ඉලක්කම් සියල්ල ම භාවිතයෙන් සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව ලියන්න.

: ..........................................

**19.** සමාන පාද සහිත ත්‍රිකෝණාකාර පැති 4කින් පමණක් සෑදුණු ඝන වස්තුවේ නම කුමක් ද?

: ..........................................

**20.**



මෙම රූපයේ පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

: ..........................................

**21.**



ටැංකියේ සිටින මාළුවන් ගණන රෝම සංඛ්‍යාංකවලින් ලියන්න.

: ..........................................

**22.** පාසලක විවිධ ප්‍රසංගයක් පැය 11:30ට ආරම්භ වී පැය 14:15ට අවසන් විය. විවිධ ප්‍රසංගය පැවැත්වුණු කාලය කොපමණ ද?

: ..........................................

**23.** (i) මෙම සංඛ්‍යා රටාවේ ඊළඟ සංඛ්‍යාව ලියන්න. 3, 12, 21, 30, ..........................

(ii) පහත දී ඇති සංඛ්‍යා පිළිවෙළ අනුව, සංඛ්‍යා රටාවක් ලබා ගැනීමට ඉවත් කළ යුතු සංඛ්‍යාව කුමක් ද?

64, 46, 32, 16, 8 : ..................

[5 වැනි පිටුව බලන්න.

**24.** ත්‍යාග ප්‍රදානය කිරීමේ උත්සවයක් සඳහා පොත් 810ක් ලැබී ඇත. පාර්සලයකට පොත් 4 බැගින් ඇතුළත් වන සේ තැගි පාර්සල් කීයක් සැදිය හැකි ද?

:..............................................................

**25.** 


රවුම තුළ ඇති සංඛ්‍යාවලින් 8හි ගුණාකාර තෝරා ලියන්න.

:..............................................................

**26.** ඉදිරියෙන් දී ඇති රූපයෙන් $\frac{1}{2}$ක් (පැන්සලෙන් හෝ පෑනෙන්) පාට කරන්න.



**27.** 


(i) මෙම රූපය ඇතුළත සෘජු කෝණ කීයක් තිබේ ද?

:..............................................................

(ii) මෙම රූපයේ පරිමිතිය සොයන්න.

:..............................................................

**28.** පහත දී ඇති රූපය ඇසුරෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) පාට කළ කොටසේ වර්ගඵලය, කොටු කීයකට සමාන වේ ද?

:..............................................................

(ii) සෑම කුඩා කොටුවක ම දිග 1 cmක් හා පළල 1 cmක් වේ. පාට **නොකළ** කොටසේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර කීය ද?

:..............................................................

**29.** වෙළෙඳසලක තබා ඇති මිල දර්ශනයක කොටසක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| කිරි පිටි පැකට් | 1 ක් | රු. 350.00 |
| තේ කොළ | 1 kg ක් | රු. 824.00 |
| සීනි | 1 kg ක් | රු. 95.00 |

පාසලක ශ්‍රමදානයට සහභාගි වූ අයට කිරි තේ ලබා දීම සඳහා, පහත සඳහන් වගුවේ දැක්වෙන පරිදි ද්‍රව්‍ය මිල දී ගනු ලැබිණි.

(i) මිල දර්ශනයට අනුව වගුවේ හිස්තැන් පුරවන්න.

| මිල දී ගත් ද්‍රව්‍යය | ප්‍රමාණය | මුදල | |
|---|---|---|---|
| | | රු. | ශත |
| කිරි පිටි | පැකට් 4 | 1 400 | 00 |
| තේ කොළ | 250 g | ...... | ...... |
| සීනි | 2 kg | ...... | ...... |
| | එකතුව | ...... | ...... |

(ii) කිරි තේ සකස් කිරීමේ දී පළමුව ලීටර 4යි මිලිලීටර 750 ක් ද දෙවනුව ලීටර 3 යි මිලිලීටර 450ක් ද සකස් කෙරිණි. සැකසූ මුළු කිරි තේ පරිමාව කොපමණ ද?

:..............................................................

[6 වැනි පිටුව බලන්න.

**30.** 2015 වර්ෂයේ පරිසර දිනය වෙනුවෙන්, 5 ශ්‍රේණියේ සිසුන් පිරිසක් විසින් තම පාසල් වත්තේ වගාකරන ලද, මල් පැළ වර්ග පිළිබඳ තොරතුරු මෙම ප්‍රස්තාරයේ දැක්වේ.




(i) වගාකරන ලද රෝස පැළ සංඛ්‍යාව, කපුරු පැළ සංඛ්‍යාව මෙන් දෙගුණයකි. කපුරු පැළ සංඛ්‍යාව ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

(ii) අඩුවෙන් ම වගාකර ඇති පැළ වර්ගයෙහි නම කුමක් ද?

:......................................................................................

(iii) වගාකරන ලද මුළු පැළ සංඛ්‍යාව කොපමණ ද?

:......................................................................................

- ප්‍රශ්න අංක **31** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

**31.** බොහෝ සුවඳවත් මලකි.
(1) සේපාලිකා (2) ඇන්තූරියම් (3) වද (4) බෝගන්විලා

**32.** වැල්වල සැදෙන පලතුරු වර්ගයකි.
(1) නෙල්ලි (2) මිදි (3) දෙළුම් (4) දිවුල්

**33.** අතුවල මෙන් ම කඳෙහි ද ගෙඩි හට ගන්නා ශාකයකි.
(1) කොස් (2) වෙරළු (3) මැංගුස් (4) රඹර්

**34.** අලංකාරය සඳහා තබන මල් බඳුනක, මල්, වැඩි දින ගණනක් හොඳින් තබා ගැනීම සඳහා මල් බඳුනේ ඇති ජලයට එකතු කිරීමට සුදුසු ද්‍රව්‍යය කුමක් ද?
(1) අසමෝදගම් (2) ඕඩිකොලොන් (3) ලුණු (4) ඇස්ප්‍රීන්

**35.** ශ්‍රී ලංකාවේ ඒකදේශික ක්ෂීරපායි සතෙකි.
(1) කැහිබෙල්ලා (2) ගල්පාඩියා (3) කළු වඳුරා (4) පිඹුරා

**36.** ශක්තිය වඩවන ආහාරයකි.
(1) නිවිති (2) බෝංචි (3) බණ්ඩක්කා (4) දෙල්

**37.** මීයාගේ ඇගේ වසන මැක්කකු මගින් බෝ වන රෝගය කුමක් ද?
(1) පාචනය (2) බරවා (3) ජලභීතිකාව (4) මහාමාරිය

**38.** වගාවලට හානි කරන ගොළුබෙල්ලන් ආහාරයට ගන්නා සතෙකි.
(1) මුගටියා (2) ඇටිකුකුළා (3) ඉත්තෑවා (4) නයා

**39.** ඇඹුල් දැමීම **නුසුදුසු** වන්නේ, පහත සඳහන් කුමන භාජනයක ආහාර සකස් කරන විට ද?
(1) මැටි භාජනයක (2) ඇලුමිනියම් භාජනයක
(3) ප්ලාස්ටික් භාජනයක (4) වීදුරු භාජනයක

**40.** මදුරුවන් අප වෙත ළං වීම වැළැක්වීම සඳහා ශරීරයේ තැවරීමට සුදුසු තෙල් වර්ගයකි.
(1) එළවලු තෙල් (2) තල තෙල් (3) පැඟිරි තෙල් (4) පොල් තෙල්

**41.** ගැඹුරු ළිඳකින් ජලය ඉහළට ගැනීම සඳහා භාවිත කෙරෙන වැඩ පහසු කිරීමේ යන්ත්‍රය කුමක් ද?
(1) ජල රෝදය (2) ඇති රෝදය (3) කරාමය (4) කප්පිය

[7 වැනි පිටුව බලන්න.

**42.** 

කොට්ට උරයකට, රූපයේ දැක්වෙන පරිදි මලක් මැසීමේ දී මල්පෙති වටේ යෙදිය යුතු මැස්ම කුමක් ද?

(1) දම්වැල් මැස්ම (2) නැටි මැස්ම
(3) බ්ලැන්කට් මැස්ම (4) කතිර මැස්ම

**43.** මහවැලි ගඟ මුහුදට වැටෙන ස්ථානයට ආසන්න ම නගරය කුමක් ද?

(1) ත්‍රිකුණාමලය (2) මඩකලපුව (3) මුලතිව් (4) පුත්තලම

**44.** ලී කැටයම්වලට ප්‍රසිද්ධ ස්ථානයකි.

(1) යාපහුව බලකොටුව (2) ලෝවාමහාපාය
(3) ඇම්බැක්ක දේවාලය (4) ඉසුරුමුණිය විහාරය

**45.** සියලු ම ආගමික බැතිමතුන් විසින් වැඳ පුදා ගන්නා ශ්‍රී පාද ස්ථානය පිහිටි පළාත කුමක් ද?

(1) ඌව (2) මධ්‍යම (3) නැගෙනහිර (4) සබරගමුව

**46.** ශ්‍රී ලාංකික ජනතාව විසින් නිදහස් දිනය සමරනු ලබන්නේ,

(1) ජනවාරි 01 වැනි දා ය. (2) පෙබරවාරි 04 වැනි දා ය.
(3) අප්‍රේල් 13 වැනි දා ය. (4) මැයි 01 වැනි දා ය.

**47.** ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය හා රාජ්‍ය ලාංඡනය යන දෙකෙහි ම ඇති සංකේතය කුමක් ද?

(1) පලාපෙති (2) පුන්කලස
(3) බෝ පත් (4) කඩුවක් රැගත් සිංහයා

**48.** සෑම ශ්‍රී ලංකා මුදල් නෝට්ටුවක ම ඇති පොදු ලක්ෂණයකි.

(1) පුන්කලසක රූපයක් තිබීම
(2) දිය ඇල්ලක රූපයක් තිබීම
(3) ශ්‍රී ලංකා මහ බැංකුව යන්න සටහන් කර තිබීම
(4) නෝට්ටුවේ අගය සිංහල හා දෙමළ භාෂාවලින් පමණක් සටහන් කර තිබීම

**49.** ඔලිම්පික් කොඩියේ ඇති රවුම්වල වර්ණ තුනක් සඳහන් පිළිතුර තෝරන්න.

(1) රතු, නිල්, කහ (2) රතු, කළු, දම් (3) කළු, කොළ, දුඹුරු (4) නිල්, සුදු, රතු

**50.** ආහාර ගැනීම සම්බන්ධ ව අප තුළ තිබිය යුතු හොඳ පුරුද්දකි.

(1) ක්ෂණික ආහාර නිතර භාවිතය
(2) පැණි රස ආහාර වැඩිපුර අනුභව කිරීම
(3) ප්‍රධාන ආහාර වේල් සඳහා පලා වර්ගයක් එකතු කර ගැනීම
(4) විවේකයක් ලැබෙන සෑම විට ම ආහාර අනුභව කිරීම

**51.** ආපණ ශාලාවක තබා ඇති, රූපයේ දැක්වෙන ① සහ ② භාජනවලට දැමීමට සුදුසු ද්‍රව්‍ය 2ක් **පිළිවෙළින්** දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කෙසෙල් ලෙලි, කඩදාසි
(2) ඉතිරි වූ ආහාර, කඩදාසි
(3) කඩදාසි, යෝගට් කෝප්ප
(4) යෝගට් කෝප්ප, ප්ලාස්ටික් බූඩි




**52.** 'පළල් මාර්ගය' පෙන්නුම් කිරීමට භාවිත කෙරෙන රූපික ප්‍රකාශනය කුමක් ද?




(1) (2) (3) (4)

[8 වැනි පිටුව බලන්න.

**53.** ඉවත දමන වැහිපිහිලි කැබැල්ලක් බෝග වගාවට යොදා ගෙන ඇති ආකාරය රූපයේ දැක්වේ. මෙම විකල්ප ක්‍රමය පිළිබඳ ව පහත සඳහන් කුමක් නිවැරදි ද?



(1) සාත්තු කිරීම අපහසු ය.
(2) එක ම ස්ථානයක තබා වගා කළ යුතු ය.
(3) සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම අපහසු ය.
(4) ඉඩකඩ සීමා වූ තැන්වල බෝග වගාවට සුදුසු ය.

**54.** තොරතුරු සජීව ලෙස ද අපට ලබා දෙන මාධ්‍යයකි.

(1) පුවත්පත (2) අත් පත්‍රිකා (3) ගුවන්විදුලිය (4) දැන්වීම

**55.** තැපැල් පෙට්ටියක සටහන් කර ඇති දෙයකි.

(1) විවෘත කරන්නාගේ නම (2) ලිපියකට තිබිය හැකි වැඩි ම බර
(3) ලිපි ගන්නා වේලාව (4) ලිපි ගන්නා දිනය

**56.** A හා B කුඩා වීදුරු දෙකට, නිරෝගී මුං බීජ සමාන ප්‍රමාණ දමා ඇති අතර බීජ හොඳින් වැසෙන පරිදි A වීදුරුවේ ජලය දමා ඇත. B වීදුරුවේ බීජ තෙත පුළුන් මත තැන්පත් කර ඇත. එම වීදුරු දෙක හිරු එළිය ඇති ස්ථානයක තබා, දින කිහිපයකින් පරීක්ෂා කළ විට ලැබෙන නිරීක්ෂණය කුමක් විය හැකි ද?




(1) A වීදුරුවෙහි බීජ හොඳින් පැළ වේ.
(2) B වීදුරුවෙහි බීජ හොඳින් පැළ වේ.
(3) A හා B වීදුරු දෙකෙහි ම බීජ හොඳින් පැළ වේ.
(4) A හා B වීදුරු දෙකෙහි ම බීජ පැළ නො වේ.

**57.** විදුලි බුබුළ නිපදවීමේ ගෞරවය හිමි වන්නේ,

(1) ජෝන් ලොගී බෙයාර්ඩ් මහතාට ය.
(2) තෝමස් අල්වා එඩිසන් මහතාට ය.
(3) ආතර් සී. ක්ලාක් මහතාට ය.
(4) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් මහතාට ය.

**58.** අනතුරක් සිදු වීමට වඩාත් ම ඉඩ ඇති අවස්ථාවකි.

(1) සංඥා එළි පුවරුවක රතු පාට මිනිසා දිස්වෙමින් තිබිය දී කහ ඉරි මතින් වාහන ගමන් කිරීම
(2) අකුණු අවස්ථාවක නිවෙසක ලී ඇඳක් මත නිදාගෙන සිටීම
(3) ක්‍රීඩා උත්සවයක් අවසන් වූ විට රතිඤ්ඤා පත්තු කිරීම
(4) වියළි රබර් පාපිස්සක් මත සිටගෙන විදුලි ඉස්තිරික්කයෙන් ඇඳුම් මැදීම

**59.** පුද්ගලයකුගේ පාදයකට සර්පයකු දෂ්ට කර ඇති අවස්ථාවක, එම පුද්ගලයාට ප්‍රථමාධාර ලබා දීමේ දී මුලින් ම කළ යුතු වන්නේ,

(1) සර්පයා සොයා හඳුනා ගැනීම ය.
(2) දෂ්ට කළ ස්ථානය පිරිසිදු ඇල් ජලයෙන් සේදීම ය.
(3) වෙළුම් පටි මගින් පාද දෙක ගැට ගසා නොසොලවා තැබීම ය.
(4) උණු පානයක් ලබා දීම ය.

**60.** "මම මගෙන් ඉටු විය යුතු යුතුකම් නිවසටත්, පාසලටත්, රටටත් ඉටු කරන දරුවෙක් වෙමි." මෙසේ සිතීම, සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමක කී වැනි පියවරට අයත් වේ ද?

(1) පළමුවැනි (2) දෙවැනි (3) හතරවැනි (4) පස්වැනි

***

2129

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

රහස්‍ය ලේඛනයකි

# පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට

# පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2015 අගෝස්තු

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස්

## සහ

## ලකුණු දීමේ පටිපාටිය

## I පත්‍රය





සියලු ම හිමිකම් ඇවිරිණි.

සංශෝධනවලට යටත් ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2015 අගෝස්තු

## I පත්‍රය

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

**1. උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී සැලකිය යුතු කරුණු**

1.1 සෑම ප්‍රශ්නයක ම නිවැරදි ප්‍රතිචාරයක් සඳහා " √ " ලකුණ ද වැරදි ප්‍රතිචාරයක් සඳහා " × " ලකුණ ද පිටුවෙහි ප්‍රධාන කොටුවෙන් පිටත දකුණුපස තීරයෙහි පැහැදිලි ව සටහන් කරන්න.

1.2 එක් එක් පිටුවේ නිවැරදි පිළිතුරු සඳහා වූ " √ " ලකුණුවල එකතුව එම පිටුවේ දකුණුපස පහළ කෙළවරේ ඇති **කොටුව තුළ අංක දෙකකින් පැහැදිලිව සටහන් කරන්න.**

1.3 එක් එක් පිටුවේ සටහන් කළ "√"ලකුණුවල එකතුව මුල් පිටුවේ අදාළ පිටු අංකයට ඉදිරියෙන් ඇති කොටුව තුළ සටහන් කරන්න.

1.4 මුළු "√" ලකුණුවල එකතුව අවසාන ලකුණ යටතේ ඉලක්කමෙන් සහ අකුරෙන් අදාළ කොටු තුළ ලියන්න.

**2. ලකුණු ලැයිස්තු සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු**

2.1 ලකුණු ලැයිස්තුවේ "ලකුණු එකතුව **1** පත්‍රය තීරුවේ" **40** ලෙසට සටහන් කරන්න.

2.2 එම තීරුවේ එක් එක් අපේක්ෂකයාගේ විභාග අංකය ඉදිරියේ ඊට නියමිත උත්තර පත්‍රයේ සඳහන් අවසාන ලකුණ සටහන් කරන්න.

2.3 අවසාන ලකුණ ඉදිරියෙන් එක් තීරුවක් ඉතිරි කර එය අකුරෙන් පැහැදිලිව ලියන්න.

